කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
கைத்தொழில் மற்றும் வணிகம் பற்றிய அமைச்சு
Ministry of Industry and Commerce

# පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්
# பரந்தன் கெமிக்கல்ஸ் கம்பனி லிமிடெட்
# Paranthan Chemicals Company Limited

## වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
## Annual Report
# 2020

කර්මාන්ත අමාත්‍යාංශය

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

වාර්ෂික වාර්තාව 2020

# පටුන


1 සමාගමේ පසුබිම

2 දේශිය, රසායනික වෙළඳපොළ සහ එහි අභියෝගයන්

3 සංස්ථාපිත තොරතුරු

4 සමාගමේ දැක්ම, මෙහෙවර,ඉලක්ක හා අරමුණු

6 සභාපතිතුමාගේ සමාලෝචනය

7 සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය

9 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

13 2020 වර්ෂය තුළදී ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

14 සීමාසහිත පරන්තන් කෙමිකල්ස් සමාගමේ කොටස් හිමියන්ට විගණකවරයාගේ වාර්තාව

22 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා විස්තිර්ණ ආදායම් ප්‍රකාශය

23 2020 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ව ප්‍රකාශය

24 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා ස්කන්ධ මුල ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

25 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

27 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

33 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා ගිණුම් සඳහා සටහන්

39 සංවිධාන ව්‍යුහය-උපයමාර්ගික ව්‍යාපාරික ඒකකය

40 සංවිධාන ව්‍යුහය

41 2019,2020 වර්ෂ සඳහා මෙහෙයුම් හා මුල්‍ය දත්ත සහ 2021 වර්ෂය සඳහා අයවැය ගත සංඛයා

42 සමාගමේ කාර්යසාධනය ඇගයීම

43 ආයතනික යහපාලනය

46 විගණන කමිටු වාර්තාව

47 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා ප්‍රධාන මුල්‍යමය අවස්ථා ඇතුළත් පස් අවුරුදු සාරාංශය

48 රැස්වීම පිළිබඳ දැන්වීම

## සමාගමේ පසුබිම

පරන්තන් කෙමිකල්ස් රසායන සමාගම රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක් වන අතර දේශිය කර්මාන්තවලට අවශ්‍ය ප්‍රධාන රසායනික ද්‍රව්‍යයන් වන දියර ක්ලෝරීන් කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ආනයනය කර වෙළඳපොලට සැපයීම සිදු කරනු ලබයි. දියර ක්ලෝරීන් වෙළඳපොලේ ප්‍රධාන සැපයුම්කරුවා වන පරන්තන් කෙමිකල්ස් සමාගම අනෙකුත් රසායනික ද්‍රව්‍ය සඳහා ද වෙළඳපොලෙන් සැලකිය යුතු කොටසකට හිමිකම් කියනු ලබයි.

1950 දශකයේ උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් හි රජයේ කර්මාන්තශාලාවක් වශයෙන් ආරම්භ කරන ලද පරන්තන් රසායනික කර්මාන්තශාලාව 1957 වර්ෂයේ දී පරන්තන් කෙමිකල්ස් සංස්ථාව වශයෙන් ස්ථාපනය කරන ලදී. 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ ආරම්භයේ දී මෙම කර්මාන්තශාලාව මගින් දේශිය ලුණු අමුද්‍රව්‍යක් වශයෙන් භාවිතා කරමින් කෝස්ටික් සෝඩා, දියර ක්ලෝරීන්, හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය ප්‍රධාන නිෂ්පාදන වශයෙන් ද සින්ක් ක්ලෝරයිඩ්, ෆෙරික් ක්ලෝරයිඩ් හා මේස ලුණු අතුරු නිෂ්පාදන වශයෙන් ද වෙළඳපොලට ඉදිරිපත් කරන ලදී. 1985 දී ත්‍රස්තවාදී කලබල හේතුවෙන් පරන්තන් රසායනික කර්මාන්තශාලාවේ වැඩකටයුතු නවතා දමන ලද අතර දේශීය කර්මාන්තවලට එනම් ජල පිරිපහදුවට සබන් නිෂ්පාදනයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය ආනයනය කර සැපයීමට සිදු විය. කර්මාන්තශාලාව වසා දැමීම සිදු වීම මගින් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් රටින් පිටතට ඇදී ගිය අතර රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් ද දේශයට අහිමි විය.

දැනට ක්‍රියාත්මක වන පරන්තන් කෙමිකල්ස් සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පොදු සමාගම් පනත යටතේ 1991 ජනවාරි 17 වන දින සංස්ථාපනය කරන ලදි. රජයට අයත් සමාගමක් වන පරන්තන් කෙමිකල්ස් සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කල අතර සමාගම් පනතින් නියම කරන ලද යහපාලන ප්‍රතිපත්ති හා රජය විසින් පනවා ඇති ප්‍රතිපත්තීන්වලට අනුකූලව කටයුතු සිදු කරනු ලබයි.

සමාගම විසින් දේශිය වෙළඳපොලට අවශ්‍ය දියර ක්ලෝරීන් කිලෝග්රෑම් 900 සිලින්ඩරවලින් ආනයනය කරනු ලබන අතර ඉන් කොටසක් කිලෝග්රෑම් 68 සිලින්ඩරවලට නැවත පිරවීම ආයතනයේ නැවත පිරවුම් ඒකකය මගින් සිදු කරනු ලබයි. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමහරක් මධ්‍යස්ථානවලට හා සමහරක් සුලු පරිමාණයේ ගැනුම්කරුවන්ටද කුඩා සිලින්ඩර් සපයනු ලබන අතර එමගින් සුලු පරිමාණයේ කර්මාන්තකරුවන්ට විශාල සේවයක් ඉටු කිරීමට සමාගමට හැකි වි ඇත.

ආනයනය කරනු ලබන සියලුම සිලින්ඩර් අන්තර් ජාතික තත්ත්ව පරීක්ෂණවලට යටත්ව භාවිතා කරනු ලබන අතර දේශිය නැවත පිරවුම් කටයුතු අන්තර්ජාතික තත්වයන්ට අනුකූලව සිදු කරනු ලබයි. දිවයිනේ ක්ලෝරීන් ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම ඇති කාර්ය මණ්ඩලයක් සමාගම සතු වන අතර මේ වන විට ජලාපවහන මණ්ඩලයේ ක්ලෝරීන් භාවිතය සම්බන්ධ නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු ද ආයතනය විසින් සිදු කරනු ලබයි.

සමාගමේ ප්‍රධාන කාර්යාලය හා ගබඩාව අංක 100/25 ශ්‍රී රාමනාදන් මාවතේ පවත්වා ගෙන යනු ලබන අතර පරන්තන්හි පිහිටි අක්කර 227 භූමිය නව කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා වෙන් කර ඇත. කළුතර නාගොඩ කර්මාන්ත පුරයේ පිහිටි අක්කර 2 1/2 ක භූමිය ක්ලෝරීන් නැවත පිරවුම් කටයුතු පරිපාලනය කිරීම සඳහා යොදා ගෙන ඇත. 2014 වසරේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ සමස්ත සේවක සංඛ්‍යාව 64 ක් විය. සමාගම විසින් පසුගිය වසර කිහිපය තුළම රජයට ගෙවිය යුතු සියලුම බදු ගෙවීමෙන් පසු ලාභයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

## දේශිය රසායනික වෙළඳපොල සහ එහි අභියෝගයන්

ශ්‍රී ලංකාවේ රසායනික වෙළඳපොල ප්‍රධාන අංශ කිහිපයකින් සමන් විත වේ.

- කෘෂි රසායන
- කර්මාන්තවලට අවශ්‍ය රසායන
- රබර් කර්මාන්තයට අවශ්‍ය රසායන
- තීන්ත නිෂ්පාදනයට අවශ්‍ය රසායන
- ප්ලාස්ටික් ආශ්‍රිත කර්මාන්තයන්ට අවශ්‍ය රසායන
- ආහාර සහ බීජ නිෂ්පාදනයට අවශ්‍ය රසායන
- පුද්ගල පරිහරණයට අවශ්‍ය රසායන

රටක් වශයෙන් ශ්‍රී ලංකාව විශාල රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයක් පරිහරණයට ගන්නා අතර එම මුළු ප්‍රමාණයම වාගේ වාර්ෂිකව ආනයනය කරනු ලබයි.

පරන්තන් කෙමිකල්ස් සමාගම ප්‍රධාන වශයෙන් ජල පිරිපහදු, රසායනික සහ රබර් සහ ශීතාගාර වැනි විවිධ කර්මාන්තයන්ට අවශ්‍ය රසායනික වෙළඳපොල කටයුතු කරමින් සිටියි.

පරන්තන් කෙමිකල්ස් සමාගමේ විකුණුම් වලට අදාළ ශ්‍රී ලංකාවේ සමස්ත වෙළෙඳපොල වටිනාකම වසරකට ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.60 පමණ වන බව ගනන් බලා ඇත. මුළු වෙළඳපොලෙහි පරන්තන් කෙමිකල්ස් සමාගම දරණ දායකත්වය ඉහළ නැංවීමට වර්තමානයේ කටයුතු කරමින් සිටින අතර ඉදිරි වසර 5 තුළ වෙළඳපොල ප්‍රමුඛයා වීමට අපේක්ෂා කෙරේ.

පරන්තන් කෙමිකල්ස් සමාගම 100% ක් රජය සතු ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර ආයතනයේ ඉදිරි අරමුණ සමාගමේ සංයුක්ත සැලැස්මේ සඳහන් කර ඇති ආකාරයට ලඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **නීතිමය ස්වභාවය** | : | 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත වගකීමකින් යුතු පොදු සමාගමක් වශයෙන් ලියාපදිංචි කර 1991 දී සංස්ථාපනය කරන ලදුව පසුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචිය සිදු කර ඇත. පොදු සමාගමක් බවට පත් කිරීම පොදු ව්‍යාපාර හෝ රජයට අයිති ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ 1987 පනත් අංක 23 ට අනුකූලව සිදු කර ඇත. පරන්තන් රසායන සමාගමට හිමිව තිබූ අධිකාරී බලය සහ ක්‍රියාකාරකම් සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය මඟින් නැවතත් පරන්තන් කෙමිකල්ස් සමාගමට පවරන ලදී. |
| සංස්ථාපිත දිනය | : | 1957 දී ස්ථාපිත කරන ලද අතර 1991 ජනවාරි 17 වෙනි දින නැවත සංස්ථාපනය කරන ලදී. |
| ප්‍රධාන කාර්යාලයේ ලිපිනය | : | 100/25, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 13, ශ්‍රී ලංකාව. |
| කර්මාන්ත ඒකකය | : | BOI කලාපය, වගවත්ත,හොරණ |
| දු.අංක/ප්‍රධාන කාර්යාලය | : | +94 11 2437555-6-7; +94 11 2437831; +94 11 2387109; +94 11 2324464; +94 11 2324465; +94 11 2437829 |
| දු. අංක - කළුතර ඒකකය | : | +94 34 2289976 |
| දු. අංක - හොරණ ඒකකය | : | +94 34 3442924 |
| ෆැක්ස් | : | +94 11 2437555 |
| විද්‍යුත් තැපෑල | : | pccltd@sltnet.lk |
| වෙබ් අඩවිය | : | www.paranthanchemicals.gov.lk |
| ප්‍රධාන බැංකුකරුවෝ | : | මහජන බැංකුව |
| සභාපති | : | ආර්.කේ. යූ රණවීර මහතා(2020 ජනවාරි 16 පත් කරන ලදී) |
| ව්‍යවස්ථාපිත විගණකවරු | : | විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| විධායක අධ්‍යක්ෂ | : | |
| අධ්‍යක්ෂ මණ්ඩලය | | ඩබ්ලිව්.යූ.පෙරේරා මහතා<br>ඒ.ඩී.එස්.කේ.නන්දසිරි මහතා<br>එල්.යූ.පී.වික්‍රමසිංහ මහතා<br>එස් අමරවීර මහතා<br>ඩී.කේ.සුමනදාස මහතා<br>සී.එච්.රණතුංග මහත්මිය<br>ප්‍රියංගනී මහත්මිය |
| | | - 2020 ජනවාරි 16 වන දින පත් කරන ලදී.<br>- 2020 ජනවාරි 16 වන දින පත් කරන ලදී.<br>- 2020 ජනවාරි 16 වන දින පත් කරන ලදී.<br>- 2020 ජනවාරි 16 වන දින පත් කරන ලදී.<br>- 2020 ජනවාරි 16 වන දින පත් කරන ලදී<br>- 2020 ජනවාරි 17 වන දින පත් කරන ලදී.<br>- 2020 සැප්තැම්බර් 15 වැනි දින විශ්‍රාම ගියේය.<br>- 2020 සැප්තැම්බර් 15 දින පත් කරන ලදී. |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | : | එච්. එල්. විපුල සිල්වා මහතා |
| ප්‍රධාන නිලධාරීන් | : | • වැඩබලන සාමාන්‍යාධිකාරී - ජී.ඒ.ජේ. විජේසුන්දර මහතා<br>• නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) - තිස්ස ලියනගේ මහතා |
| අභ්‍යන්තර විගණක | : | තිලක් ජයතිලක හා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සමාගම (පත්වීම් දිනය : 2016 ජනවාරි 01 ") |

## සමාගමේ දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු

**දැක්ම**

ශ්‍රී ලංකාවේ රසායනික නිෂ්පාදන හා වෙළඳපොල පෙර ගමන්කරු ලෙසත් රාජ්‍ය අනුග්‍රහය සහිත වෙළඳපොල නියාමක ලෙසත් අනාගතයේ දී වෙළඳපොල තුල ස්ථාපිත වීම.

**මෙහෙවර**

කර්මාන්තවලට අවශ්‍ය තත්ත්වයෙන් උසස් රසායන යෙදවුම් රට තුල නිෂ්පාදනය කර හෝ ආනයනය කර සැපයීම මගින් දේශීය රසායන කර්මාන්තවල ගුණාත්මක භාවය වැඩි කිරීමට දායකවීම.

**ඉලක්ක**

- ශ්‍රී ලංකවේ රසායන වෙළඳපොල තුල නියමුවා බවට පත්වීම.
- පරන්තන් හි කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් කර්මාන්ත ශාලාව නැවත ක්‍රියාත්මක කරවීම.
- බ්ලීචිං පවුඩර් හා සල්පියුරික් අම්ල ආදිය නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ඒකක ස්ථාපිත කිරීම.
- සේවක තෘප්තිමත් භාවය වර්ධනය කිරීම සහතික කිරීම සහ ඔවුන්ගේ කැපවීම හා උපරිම සේවාව සමාගමට ලබා ගැනීම.
- ආයතනය තුළ දැනට පවතින භෞතික සම්පත් හිඟතාවය මගහැරීම

**ආයතනයේ අරමුණු**

සමාගමේ ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ ප්‍රධාන අරමුණු පහත දැක් වේ.

**මූලික අරමුණු**

"1955 අංක 19 දරණ පනතේ රාජ්‍ය සංස්ථා සඳහා වන වගන්තිය සහ 1956 මාර්තු 01 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 10898 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ පසුව සංශෝධනය කරමින් ඉදිරිපත් වූ 1957 අංක 49 දරණ රජයේ කර්මාන්ත සංස්ථා පනතේ 2 වැනි වගන්තියට අනුව සහ 1959 ජනවාරි 01 වන දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් අංක 11, 632 ට අනුව, සංස්ථාපනය කරන ලද පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ කටයුතු කර ගැනීම හා පවත්වාගෙන යාම සඳහා,

අ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම නිශ්චල හා චංචල දේපලවල හිමිකාරිත්වය දැරීම.

ආ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ හිමිකාරිත්වය පැවති සියලුම වත්කම් පුරස්කාර අයිතිය, අධිකාරීමය බලය, වරප්‍රසාද හා වත්කමෙන් පැන නගින අයිතීන් සඳහා හිමිකාරිත්වය දැරීම.

ඇ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම වගකීම් දැරීම

ඈ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ ගිණුම් භාර ගැනීම, පවත්වාගෙන යාම හා ව්‍යාපාරයට අදාළ ලියකියවිලි හැසිරවීම.

ඉ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාවේ සියලුම කොන්ත්‍රාත් සහ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම.

ඊ. පරන්තන් කෙමිකල්ස් සංස්ථාව විසින් පවත්වා ගෙන පැමිණි නීතිමය කටයුතු පවත්වා ගෙන යාම.

එ. ශ්‍රී ලංකාවේ පවත්නා නීති රීතිවලට අනුව සේවකයන් හට සමාගමේ කොටස් මිලදී ගැනීම සඳහා කොටස් භාරයක් ස්ථාපිත කිරීම.

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම:

i. කෝස්ටික් සෝඩා, ක්ලෝරීන්, සල්ෆියුරික් අම්ලය, පොහොර, දිලීර නාශක, කෘමිනාශක ද්‍රව්‍ය වැනි ඉහත දක්වා ඇති කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍ය, සේදුම්කාරක සහ වෙනත් රසායනික ද්‍රව්‍යයන් නිෂ්පාදනය හා විකිණීම.

ii. ඉහත දක්වා ඇති නිෂ්පාදන ක්‍රියාවලීන්හි දී නිපදවන හයිඩ්‍රෝක්ලෝරික් අම්ලය, සින්ක් ක්ලොරයිඩ්, පෙරික් ක්ලෝරයිඩ් සහ මේස ලුණු වැනි ඕනෑම අතුරු නිෂ්පාදනයක් සංවර්ධනය කිරීම, නිපදවීම හා අලෙවි කිරීම.

iii. ඉහත දක්වා ඇති ඕනෑම නිෂ්පාදනයක් ආනයනය කිරීම හා විකිණීම.

iv. රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය, තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම, තොග පවත්වා ගෙන යාම, විශ්ලේෂණ රසායනය, වියළි ලුණු නිෂ්පාදනය, තෙල් සහ වර්ණක, ආනයනය සහ අපනයනය, ප්ලාස්ටික් නිෂ්පාදනය සහ වෙළඳාම, සින්තටික් හා ෆයිබර් විශාල සහ කුඩා රසායනයන්, ඖෂධ සාරය, පලතුරු බීම, අම්ල, රසායනික ද්‍රව්‍යයන්, කර්මාන්ත හා වෙනත් සැකසීම්, ඛනිජ සහ ජලය, පුපුරණ ද්‍රව්‍ය, වෙඩි බෙහෙත්, නිෂ්පාදන සහ සියලුම ආකාරයේ උපාංග, පණුබෙහෙත්, දිලීර නාශක, සිමෙන්ති, තීන්ත, වාර්නිෂ්, ඖෂධ, සියලුම ආකාරයේ විදුලි, රසායනික, ඡායාරූපකරණය, ශල්‍ය හා විද්‍යාත්මක උපකරණ සහ සමාන ද්‍රව්‍ය හෝ සම්බන්ධිත ව්‍යාපාර වැනි, ඉහත ව්‍යාපාරවලට යොමු වීම.

**වර්තමානයේ සමාගමේ කාර්යභාරය**

දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා පතුරු හා හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආදිය ආනයනය කිරීමත් විකිණීමත් පරන්තන් කෙමිකල්ස් සමාගමේ වර්තමාන ප්‍රධාන ක්‍රියාවලියයි.

## සභාපතිතුමාගේ සමාලෝචනය

සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රජයට අයත් ලාභ ලබන සමාගමකි. රසායනික නිෂ්පාදනය, ආනයනය සහ බෙදා හැරීම සම්බන්ධ වෘත්තීමය වශයෙන් කළමනාකරණය කරන ලද ව්‍යවසායයක් ලෙස, ජලය පිරිසිදු කිරීම සහ දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ලබා ගැනීම සහතික කිරීමේදී සමාගම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ ප්‍රධාන ප්‍රධාන අරමුණු අතරට ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න ජාතියක් ඇති කිරීම සහ ප්‍රාථමික රසායනික අංශයේ රජයේ ක්‍රියාකාරී පැවැත්ම සහතික කිරීම සහ රසායනික කර්මාන්තයේ රසායනික ද්‍රව්‍ය හැසිරවීමේ ක්‍රියාකාරි දායකත්වයක් දැක්වීම ඇතුලත් වේ.

මේ වන විට සමාගම ජාතික වෙළඳපොලේ දියර ක්ලෝරීන් ප්‍රධාන සැපයුම්කරු වන අතර අනෙකුත් රසායනික ද්‍රව්‍යවල ද සාධාරණ වෙළඳපල කොටස ලබාගෙන ඇත. දේශීය ලුණු නිෂ්පාදනයට වටිනාකමක් එක් කරන කෝස්ටික් සෝඩා, ක්ලෝරීන් සහ ඒ ආශ්‍රිත වෙනත් රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ ඉතිහාසයක් ඇති සමාගමක් ලෙස පරන්තන් කෙමිකල් සමාගම පරන්තන් ප්‍රදේශයේ කර්මාන්ත ශාලාව නැවත ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීමේදී එය වත්මන් පාරිසරය ප්‍රතිපත්ති තුළ තිරසාර බව සහතික කළ යුතුය. පරන්තන් සමාගම ලබා ගත් සමස්ත කළමනාකරණ කුසලතා සහ ඉංජිනේරු අත්දැකීම් සහ එහි සන්නාම නාමයෙන් ලබාගත් හොඳ හිත අනාගත ව්‍යාපෘතිය සඳහා පදනම වනු ඇත.

සමාගම ලාභ සහිතව පවත්වාගෙන යන අතර වැටුප් සහ අනෙකුත් දීමනා ඇතුළු සියලු වියදම් එහි අරමුදල්වලින් ගෙවන බව සඳහන් කිරීම ඉතා වැදගත්ය. සමාගම වාර්ෂිකව මහා භාණ්ඩාගාරයට ලාභාංශ ගෙවනු ලැබේ. තවද කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා පුළුල් වෛද්‍ය සෞඛ්‍ය රක්‍ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.

2015 වර්ෂය තුළ සමාගම විසින් සිදු කරන ලද වැදගත් කාර්යයන් පිළිබඳ වැදගත් තොරතුරු රැසක් 2015 වාර්ෂික වාර්තාව තුළ ඇතුලත් වේ. එය තවදුරටත් සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගමේ හැකියාවන් සහ පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා ආලෝකය සපයනු ලබයි.

### කෘතඥතා පිරිනැමීම

මාගේ රාජකාරි කටයුතු සහ වගකීම් ඉටු කිරීමේදී සමාගම වෙත හා මා හට ලබා දුන් අනුපමේය සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාට, ගරු ඇමතිතුමාට, අමාත්‍යාංශයේ ලේකම්තුමාට, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ භාණ්ඩාගාරයේ ලේකම්තුමා මාගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

බාහිර විගණකවරුන් වන රන්වත්ත සහ සමාගමටත්, අභ්‍යන්තර විගණකවරුන් වන කේ. ලියනගේ සහ සමාගමටත්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ටත්, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ටත්, සමාගමේ සියලු කාර්ය මණ්ඩලයට සහ සේවක පිරිසටත් මගේ කෘතඥතාවය පිරිනමනුයේ සමාගමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ඔවුන් විසින් ලබා දුන් අප්‍රතිහත වෙහෙස සහ කැපවීම වෙනුවෙනි.

අපගේ වටිනා ගනුදෙනුකරුවන්ගේ අනුග්‍රහය නොලැබෙන්නට සමාගම පවත්වාගෙන යාමට නොහැකි වන බව මෙහි ලා අවධාරණය කළ යුතුය. ඔවුන් සියලු දෙනා විසින් ඍජුව සහ වක්‍රව දැක්වූ සහයෝගය කෘතඥතා පූර්වකව අගය කරන අතර 2020 වසරේදී සමාගමේ පැවැත්ම උදෙසා ඔබ සැමගේ සහයෝගය සහ සේවය බලාපොරොත්තු වෙමි.

උපුල් රණවීර
සභාපතිතුමා
පරන්තන් කෙමිකල්ස් සමාගම
2022 පෙබරවාරි 02 වැනි දින

## සාමාන්‍යාධිකාරීතමාගේ සමාලෝචනය

2020 දී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ආදායම් මාර්ගය ක්ලෝරීන් (Chlorine), කෝස්ටික් සෝඩා (Caustic Soda) සහ හයිඩ්‍රොක්ලොරික් අම්ලය (Hydrochloric Acid) යන භාණ්ඩ අලෙවි කිරීමට පමණක් සීමාවිය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල සමාගමේ පිරිවැටුම රු. මිලියන 306 විය. එය පෙර වර්ෂයට සාපේක්ෂව 7.47% ක වැඩිවීමකි. නමුත් සමාගමට ලබාගත හැකි වූ ලාභාංශය බදු ගෙවීමට පෙර රු.මිලියන 82 ක් වූ අතර එය පෙර වර්ෂයේ ලාභයට සාපේක්ෂව සුළු වශයෙන් අඩු වීමකි. සමාගමේ ස්ථාවර තැන්පත්වලට ලැබුණු පොලී ප්‍රතිශතය පහල බැසීම ඊට බලපෑ හේතුවයි.

මේ වර්ෂයේද සමාගමේ සමස්ත ආදායමෙන් වැඩි කොටසක් දියර ක්ලෝරීන් අලවියෙන් ලබා ගැනීමට හැකි වූ අතර කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රොක්ලොරික් අම්ලය අලෙවි කිරීමෙන් බලාපොරොත්තු වූ ආදායම ලබා ගැනීමට නොහැකි විය. වෙළඳපොලෙහි මෙම රසායන ද්‍රව්‍ය අඩු මිලට මිලදී ගත හැකි වීම නිසා උදා වූ තරගකාරිත්වය මෙම පසුබෑමට හේතු විය.

කළුතර ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකය තුල 2012 අප්‍රේල් 20 වන දින සිදු වූ ක්ලෝරීන් කාන්දු වීම හේතුවෙන් නව නිෂ්පාදන ආරම්භ කිරීමට සමාගමට නොහැකි විය. මේ නිසා ක්ලෝරීන් නැවත පිරවීමේ කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහිත ඉඩමක් සොයා ගැනීම ආයතනයට විශාල අභියෝගයක් විය. එබැවින් පෙර සැලසුම්කර තිබුණු පරිදි නව නිෂ්පාදන වන බ්ලීචින් දියර (Bleaching Liquid) සහ බ්ලීචින් කුඩු (Bleaching Powder) නිෂ්පාදනය ආරම්භ කිරීමට නොහැකි විය. හොරණ පිහිටි පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුගේ පරිශ්‍රයකදී බ්ලීචින් දියර නිෂ්පාදනය කලද, ඉඩකඩ ප්‍රමාණවත් නොවූ නිසා නිෂ්පාදනය කිරීමට හැකි වුයේ සීමිත ප්‍රමාණයකි.

### ක්ලෝරීන් ආරක්ෂාකාරී ලෙස භාවිතය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග

කළුතර කර්මාන්ත ඒකකය තුල සිදු වූ ක්ලෝරීන් කාන්දු වීමේ සිද්ධියෙන් පසු ක්ලෝරීන් ආනයනය කිරීමේ සිට පාරිභෝගිකයින් පරිභෝජනය කරන තෙක් ක්ලෝරීන් භාවිතා කිරීමේදී අනතුරු ඇතිවිය හැකි කරුණු පිළිබඳ සමාගම ගැඹුරු අධ්‍යනයක යෙදිණ. එහිදී අනතුරු ඇති වීමේ අවස්ථා සහ ඒ සම්බන්ධයෙන් ගත යුතු ආරක්ෂිත පියවරවල් මේ වන විටත් හදුනා ගෙන ඇත.

2013 වර්ෂයේ අවසානයේදී ආයෝජන මණ්ඩලයට අයත් හොරණ වගවත්ත කර්මාන්ත කලාපයෙන් අක්කර 2 1/2 ක භූමි පරිශ්‍රයක් ලබා ගැනීමට හැකි වූ අතර එම පරිශ්‍රයේ ගබඩාංගනයක් ඉදි කිරීමට සහ නවීනතම තාක්ෂණයෙන් යුක්ත ක්ලෝරීන් ගෑස් අවශෝෂණ පද්ධතියක් සවි කිරීමට හැකියාව ලැබිණි. එසේම එම පරිශ්‍රය තුල නවීන ක්‍රම අනුව ක්ලෝරීන් නැවත පිරවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ඉදි කිරීම් හැකි ඉක්මනින් අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් දියර ක්ලෝරීන්, බ්ලීචින් කුඩු, සහ වෙනත් රසායන ද්‍රව්‍ය සඳහා රටේ පවතින අවශ්‍යතාව සපුරාලීමට සමාගමට හැකි වෙයි යන්න අපගේ අපේක්ෂාවයි.

කි.ග්‍රෑම් 900 ක්ලෝරීන් සිලින්ඩර් අදාළ සැපයුම් කරුවන් විසින් අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව පරික්ෂා කර අදාළ රටේ සුදුසු නියාමක බලධාරීන් සහතික කර ඇත. කි.ග්‍රෑම් 68 ක සිලින්ඩර් එකී ප්‍රමිතයන් අනුකුලව දේශීය වශයෙන් පරික්ෂා කරනු ලැබේ. ක්ලෝරීන් භාවිතයට අදාලව සිදුවිය හැකි මහජන උපද්‍රව වෙනුවෙන් මහජන වගකීම සඳහා රු. මිලියන 100 ක රක්ෂණාවරණයක් ලබාගෙන ඇත. මීට අමතරව, ක්ලෝරීන් භාවිතය පිළිබඳව සමාගමේ පුහුණු සේවකයන් විසින් වෙනත් ක්ලෝරීන් පාරිභෝගිකයන් සඳහා ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ පොම්පාගාරවල පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වා උපද්‍රව වැලැක්වීමෙදී භාවිතා කිරීම සඳහා ආරක්ෂණ උපකරණ කට්ටල හදුන්වා දී ඇත.

### මුල්‍ය අංශය

මුල්‍ය අංශය එක් විධායක නිලධාරියකුගෙන් සහ කළමනාකරණ සහකාර ශ්‍රේණියේ සේවක මහත්ම මහත්මීන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී මුල්‍ය අංශය කෙටි කාලීන උපාය මාර්ග සැකසීමේදී ද දීර්ඝ කාලීන ආයෝජන සහ සාංගමික සැලසුම් සැකසීමේදීද දායක වී ඇත. සංශෝධිත තොරතුරු අවස්ථාවෝචිතව, අධ්‍යක්ෂක මණ්ඩලයටත් රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයටත් වාර්තාකරමින් මුල්‍ය අංශය ඔවුන්ගේ ප්‍රධාන වගකීම ඉටුකරන ලදී. සැලසුම් කරන ලද ලාභාදායකත්වය ලගාකරගැනීම් වස් අවශ්‍ය වූ අවස්ථාවලදී සෙසු අංශවලට ඔවුන්ගේ මගපෙන්වීම ලබාදෙන ලදී. මුල්‍ය අංශය සමාගමේ අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය කරමින්, කාලීනව නෛතිකව අවශ්‍යතා සපුරමින්ද, බාහිර ආයතන සමග සම්බන්ධතා පවත්වමින්ද සමාගමේ සමස්ත ප්‍රගතිය අත්පත් කර ගැනීමට දායකත්වය දෙන ලදී.

### අලෙවි අංශය

සමාගමේ අලෙවි සහ බෙදාහැරීමේ කටයුතු හසුරුවන ලද්දේ අලෙවි අංශයෙනි. එම අංශය සහකාර සාමාන්‍යධිකාරවරයෙක්ගෙන්ද, කළමනාකාර සහකාරවරුන් තිදෙනෙකුගෙන් යුක්ත විය. අලෙවි අංශය ප්‍රධාන වශයෙන් දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා, හයිඩ්‍රොක්ලොරික් අම්ලය සහ බ්ලීචින් දියර වෙළඳපොළට බෙදා හරියි. භාණ්ඩ සඳහා පාරිභෝගිකයින්ගේ ඉල්ලීම අධ්‍යනය කර අවශ්‍ය පරිදි තොග පාලනය පවත්වා ගනිමින් එම අංශය කටයුතු කරයි. ඔවුහු කලින් කලට තරගකාරි වෙළඳපොලෙහි පවත්නා මිල ගනන් නිරීක්ෂණය කරනු ලබන අතර ඊට සාපේක්ෂව සමාගමේ භාණ්ඩ මිල යාවත්කාලීන කෙරේ.

### සැපයුම් අංශය

සැපයුම් අංශය ප්‍රධාන වශයෙන් සමාගමේ සියලුම මිලදී ගැනීමේ කටයුතුවල නිරතව සිටී. මෙම අංශය එක් විධායක නිලධාරිනියකගෙන් සහ කළමනාකරණ සහකාරවරුන් පස් දෙනකුගෙන් යුක්තය. සමාලෝචනයට භාජනය වන වර්ෂයේදී සැපයුම් අංශය විසින් සැපයුම් කරුවන් සමග සාකච්ජා කර, අඩු මිලට සැපයුම් ලබාගැනීමට මහත් පරිශ්‍රමයක් දරා ඇති අතර එමගින් සමාගමේ ලාභාදායකත්වය කෙරෙහි ධනාත්මක ප්‍රතිඵල ගෙනදී ඇත.

**පරිපාලන අංශය**

සමාගමේ විශාලම අංශය වන පරිපාලන අංශය සේවකයින් 27 දෙනකුගෙන් සමන්විතය. එම අංශයේ ජ්‍යෂ්ඨ විධායක නිලධාරීන් තුන්දෙනෙක්, මධ්‍යම මට්ටමේ විධායකයින් 4 දෙනෙකුත් කළමනාකරණ සහකාරවරුන් තිදෙනකුගෙන් (3) සහ ශ්‍රමික හා ක්‍රියාකාරකම් සේවයේ සේවකයින් 17 දෙනකුගෙන් සමන්විත වේ. සමාගමේ සමස්ත පරිපාලන ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ලබන්නේ මෙම අංශය මගිනි සියලු නීත්‍යානුකුල ගෙවීම් අනුමත කිරීමද, දෛනික පැමිණීමේ වාර්තා පවත්වාගෙන යෑමද සියලු පරදු දරන්නන් සමග සන්නිවේදන සහ ලිපිලේඛන පිළියෙළ කිරීමද ප්‍රවාහන කටයුතු මෙහෙයවීම සහ පරිශ්‍ර නඩත්තු කිරීම යනාදිය මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

**හොරණ සහ කළුතර නැවත පිරවීමේ ඒකක**

හොරණ සහ කළුතර නැවත පිරවීමේ ඒකක නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙක්ගෙන් (ඉංජිනේරු) විධායක නිලධාරීන් දෙදෙනකු, කළමණාකාර සහකාරවරුන් හය (6) දෙනකු, එක් වැඩ මුලිකවරයෙක්ගෙන් සහ කාර්ය සහායක සේවකයින් දොළොස් (12) දෙනෙක් සහිත කාර්ය මණ්ඩලයකින් යුක්ත වේ. එම අංශය කි.ග්‍රෑම් 68 සිලින්ඩර පිරවීමට අදාළ සමස්ත ක්‍රියාදාමය මෙහෙයවීම, ආරක්ෂක උපකරණ කට්ටල සැකසීම සහ පුහුණු කිරීමේ වැඩ සටහන් මෙහෙයවති. 2014 වර්ෂය තුලදී මෙම ඒකකය සතුටුදායක ලෙස සිය කටයුතු ඉටු කළහ.

**කෘතඥතාපූර්වක ස්තුතිය.**

සමාගමේ වැඩබලන සාමාන්‍යාධිකාරි ලෙස, අපගේ සේවක මණ්ඩලයේ හැකියාව සහ කැපවීම පිළිබඳව මට සෘජු අවබෝධයක් ඇත.

සමාගමේ දියුණුව උදෙසා මා හට නොමසුරු සහයෝගය ලබා දුන් සමාගමේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයටත් සමාගම වෙත එල්ල වූ අභියෝග හමුවේ මුලු ශක්තිය යොදවමින් දස්කම් තුල නිර්මාණශීලීව සුවච භාවයෙන් සහයෝගයෙන් කටයුතු කර ආයතනයේ දියුණුව උදෙසා කැප වූ සමස්ත සේවක මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය සහ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

ජී.ඒ.ජේ. විජේසුන්දර
සාමාන්‍යාධිකාරි
පරන්තන් කෙමිකල්ස් සමාගම

## 2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

පරන්තන් කෙමිකල්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව, ගිණුම් සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනයන් මේ සමඟ ඉදිරිපත් කරයි.

**හැඳින්වීම**

ව්‍යාපාර කටයුතු ඉදිරියට කර ගෙන යාම පිණිස 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන, රාජ්‍ය සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාව, රජයට අයත් සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1991.01.17 වැනි දින සංස්ථාපිත කැරිණි.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

දියර ක්ලෝරීන්, කෝස්ටික් සෝඩා ඝන, පතුරු සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ආනයනය කර අලෙවි කිරීම සහ කළුතර ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකයේදී කි.ග්‍රෑ. 900 සිලින්ඩර්වලින් කි.ග්‍රෑ. 68 ධාරිතාවේ සිලින්ඩරවලට දියර ක්ලෝරීන් නැවත පිරවීම, ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

**ව්‍යාපාර සමාලෝචනය**

සමාගමේ වර්ෂයේ මෙහෙයුම පිළිබඳව, සභාපතිතුමාගේ ප්‍රකාශනයේ විස්තර වශයෙන් දැක්වේ. මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ කොටසක් හා සම්බන්ධ වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

2020 දෙසැම්බර් **31** වන දිනට සමාගමේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය.

- ආර්.කේ.යූ රණවීර මහතා - සභාපති සහ අධ්‍යක්ෂ (විධායක)
- ඩබ්ලිව්.යූ.පෙරේරා මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
- ඒ.ඩී.එස්.කේ.නන්දසිරි මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
- එල්.යූ.පී.වික්‍රමසිංහ මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
- එස්.අමරවීර මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
- ඩී.කේ.සුමනදාස මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
- ජේ.පී.ප්‍රියංගනී මහත්මිය - විධායක නොවන අධ්‍යක්ෂ

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, සමාගම මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ අතර, අවශ්‍ය අවස්ථාවලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 පවත්වා ඇත.

| අධ්‍යක්ෂවරයාගේ නම | | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|---|
| ආර්.කේ.යූ රණවීර මහතා | සභාපති සහ අධ්‍යක්ෂ (විධායක) | 12 |
| ඩබ්ලිව්.යූ.පෙරේරා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 11 |
| ඒ.ඩී.එස්.කේ.නන්දසිරි මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 12 |
| එල්.යූ.පී.වික්‍රමසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 10 |
| එස්.අමරවීර මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 11 |
| ඩී.කේ.සුමනදාස මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 12 |
| සී.එච්.රන්තුංග මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 09 |
| ජේ.පී.ප්‍රියංගනී මහත්මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 03 |

**කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම**

ආර්.කේ.යූ.රණවීරල ඩබ්ලිව්.යූ.පෙරේරාල ඒ.ඩී.එස්.කේ.නන්දසිරිල එල්.යූ.පී.වික්‍රමසිංහල එස්.අමරවීරල ඩී.කේ.සුමනදාස සහ ජේ.පී.ප්‍රියංගනී යන මහත්ම මහත්මීන් දෙසැම්බර් 2020 වැනි දිනට සමාගමේ අධ්‍යක්ෂවරුන් බව තහවුරු කර ඇත. සමාගම සමඟ ගිවිසුම්වලට ඔවුන් කිසිදු උනන්දුවක් නොදැක්වූ බවයි.

**අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය**

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී අදාළ වන නීති සහ වෙනත් රෙගුලාසි අනුගමනය කිරීම සහතික කිරීම පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂවරු වගකිව යුතු වේ.

මූල්‍ය තත්වය අනාවරණය වන අයුරින් සාධාරණ නිරවද්‍යතාවයක් සහිතව සමාගමේ ගිණුම් වාර්තා පවත්වා ගැනීමෙහිලා අධ්‍යක්ෂවරු සමාන ලෙස වගකිව යුතු වේ.

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයන්හි අඛණ්ඩ පැවැත්ම සහ විෂය මූලිකත්වය පිළිබඳ වගකීම අධ්‍යක්ෂවරු භාර ගන්නා අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී පහත දැක්වෙන නීති අනුගමනය කැරෙන බවද ස්ථිර කරති.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය විසින් නිකුත් කෙරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්.
- නියමිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන අනුරූපව යොදා ගැනීම.
- මූල්‍ය ප්‍රකාශනයන්හි සත්‍ය සහ පැහැදිලි මතයක් පිළිබිඹු වීම පිණිස විචක්ෂණ සහ සාධාරණ පදනමක් මත මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වන ඇස්තමේන්තු සහ විනිශ්චයන්.

වත්කම් ආරක්ෂා කර ගැනීමෙහිලා සමාගම විසින් නියමිත, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනය කිරීම් සහ ගිණුම් වාර්තා යොදා ගෙන ඇත. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේදී සම්මත කෙරුණු යෝජනාවකට අනුකූලව සමාගමේ බාහිර විගණක හේමචන්ද්‍ර සහ සමාගම යලි පත් කෙරිණි. මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ ඔවුන්ගේ මතය දැක්වීම පිණිස උචිත බවට ඔවුන් විසින් සැලකිල්ලට ගන්නා ලද අවශ්‍ය පිරික්සා බැලීම් කර ගෙන යෑම සඳහා, නිදහස් ප්‍රවේශයන් ඔවුන් වෙත සැපයිණි. මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළව ඔවුන්ගේ වගකීම්, පසුව එන පිටුවේ දැක්වෙන විගණක වාර්තාවේ විදහා පෙන්වයි. අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ ලේඛනය

අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳ ලේඛනය 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව පවත්වාගෙන යනු ලබයි.

**අධ්‍යක්ෂවරුන්ගේ සංවේතන**

2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වේතනය, මූල්‍ය ප්‍රකාශනයන්හී 4 වැනි සටහනේ දැක් වේ.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට ආනයන බදු, තීරු බදු ආදිය ගෙවීමෙන් කෙරෙන සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවකයින්ට අදාළ වන ව්‍යවස්ථාපිත ගෙවීම්, තම උපරිම දැනීමේ සහ විශ්වාසයේ හැටියට, සමාගම විසින් නිසි පරිදි ගරු කර ඇති බවට සමාගමේ අධ්‍යක්ෂවරු සෑහීමට පත් වෙති.

**දේපල යන්ත්‍රාගාර සහ උපකරණ**

සමාලෝචිත වර්ෂය තුල දේපල, යන්ත්‍රාගාර සහ උපකරණවල සැලකිය යුතු වෙනස්වීම්, ගිණුම් 32 පිටුවේ 8 වැනි සටහනේ දැක්වේ.

**ලාභාංශ ගෙවීම්**

**යෝජිත අවසන් ලාභාංශ**

**විගණකවරයා**

සමාලෝචිත වර්ෂය තුල සමාගමේ විගණකවරයා, වරලත් ගණකාධිකාරිවරු වන රණ්වත්ත සහ සමාගම විය.

වර්ෂය සඳහා විගණක ගාස්තු වශයෙන් රු. 300,000.00 ක් ප්‍රතිපාදනය කර ඇත. තම නිදහසට හානි වනු ඇති කිසිදු සම්බන්ධතාවයක් හෝ කිසිදු ඇල්මක් විගණකවරුන් විසින් සමාගම සමග පවත්වා නොමැත.

**ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට පරීක්ෂණය**

ලාභාංශය යෝජනා කළ වහාම අධ්‍යක්ෂවරුන් විසින් සමාගම සතුව ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට තක්සේරු කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනතෙන් නියමිත ණය ගෙවීමට ප්‍රමාණවත් වත්කම් ඇති බවට පරික්ෂණය සමාගම විසින් සපුරා ඇති බව ස්ථිර කර ඇත.

**වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, (30) වැනි පිටුවේ සිට (35) වැනි පිටුව දක්වා සඳහන් කර ඇත.

**අනාගතය පිළිබඳ පෙර දැක්ම**

පරන්තන් ක්ලෝරින් කර්මාන්තශාලාව යළි නගා සිටුවීම අපගේ දැක්ම වේ.

**විගණන කමිටුව**

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය. අභ්‍යන්තර පාලන පද්ධති, ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශනයන් සහ කළමනාකරණ ගිණුම් පිළිබඳ කාර්යක්ෂමතාව සම්බන්ධව විගණන කමිටුව විසින් නිරතුරුවම සමාලෝචනය කරන ලදී.

**කෘතඥතාවය**

වර්තමාන ප්‍රගමනය කරා ලගා වීමෙහි ලා අප ගැණුම්කරුවන්ගෙන් ලද අනවරත සහාය සහ කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද සහයෝගීතාව, කැපවීම සහ දරණ ලද ප්‍රයත්නයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අගය කරනු ලැබේ.





සුදේශ් නන්දසිරි මහතා
සභාපති
2022 මාර්තු 02

ඩී.කේ.සුමනදාසමහතා
අධ්‍යක්ෂ

2020 දී ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයේ නැවත පිරවීමේ කාර්යය - පිරිසිදු කිරීමේ කාර්යය - කර්මාන්තශාලා ආරක්ෂිත ක්‍රියාකරකම්







## 2020 වර්ෂය තුල දී ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියා මාර්ග

2020 වර්ෂයේ දී ආයතනය විසින් රුපියල් මිලියන 300 ක විකුණුම් ආදායමකුත් රුපියල් මිලියන 82 ක් බදු ගෙවීමෙන් පසු ලාභයකුත් අත්කර ගැනීමට සැලසුම් කර ඇත. අපේක්ෂිත විකුණුම් ලබා ගැනීම සඳහා දියර ක්ලෝරීන් අලෙවිය වැඩි කර ගැනීමටත් කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ල සඳහා විශේෂ වැඩපිළිවෙලක් යෙදීම මගින් විකුණුම් වැඩි කර ගැනීමටත් සැලසුම් සකස් කර ඇත. මේ අනුව කෝස්ටික් සෝඩා හා හයිඩ්‍රොක්ලෝරික් අම්ල අඩු පිරිවැය යටතේ ආනයනය කර විකුණුම් වැඩිකර ගැනීමට අපේක්ෂාකරනු ලැබේ.

නව නිෂ්පාදනයන් යටතේ බ්ලීචිං පවුඩර් ආනයනය කිරීමට සැලැසුම් කර ඇත. දීර්ඝ කාලීන වශයෙන් බ්ලීචිං පවුඩර් රට තුළ නිෂ්පාදනය කර ගැනීමට හැකි වන පරිදි ඒ සඳහා 2020 වර්ෂයේ නව කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමට සමාගම සැලැසුම් කර ඇත.

මෙම ක්‍රියාවලිය සමාගමේ ක්‍රියාකාරිත්වයේ කොටසක් ලෙස සිදු කරනු ඇතැයි සමාගම අපේක්ෂා කරයි.

සමාගම 1976 වර්ෂයේ සිට වරාය අධිකාරියට අයත් ඉඩමක ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යයි. මෙම ගොඩනැගිල්ල අබලන් තත්ත්වයේ පවතින අතර අත්‍යවශ්‍ය අලුත්වැඩියාවක් හෝ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය වේ. වරාය අධිකාරිය සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් 2021 වර්ෂයේදී එම පරිශ්‍රයේම පවතින ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට හෝ නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/A/PCC/FA/2020/04 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 ජනවාරි 19 දින

සභාපති,

පරන්තන් කෙමිකල් සමාගම

**පරන්තන් කෙමිකල් සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පරන්තන් කෙමිකල් සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමහ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අංක 15 හි 9 වන වගන්තිය ප්‍රකාරව ආදායම් හඳුනාගත යුතු වුවත්, සමාගම විසින් 2018 ජනවාරි 01 වන දින අවලංගු කරන ලද ශ්‍රී ලංකා

ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 18 ප්‍රකාරව ආදායම හඳුනාගෙන ඇති බව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 4.12 මගින් අනාවරණය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අංක 09 හි 4.1.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය කළ යුතු වුවත්, 2018 වර්ෂයේදී අවලංගු කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 39 ප්‍රකාරව මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය කළ බව සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 4.4 මගින් අනාවරණය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 112 (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල වෙනත් තැනක ඉදිරිපත් කර නැති එහෙත් ඒවා තේරුම් ගැනීමට අදාළ වන තොරතුරු සැපයිය යුතු වුවත්, කර්මාන්ත අමාත්‍යාංශයට අයත් කළුතර නාගොඩ කර්මාන්තපුරයේ අක්කර 2 ක භූමි ප්‍රමාණයක සමාගමේ ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යාම සඳහා වසර 50 ක බදු පදනම මත ලබාගෙන තිබූ අතර එම ඉඩම පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 50 ඡේදය පරිදි වත්කමක ක්ෂය වන අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත වෙන් කළ යුතු අතර, 34 වන ඡේදය පරිදි ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට තවත් ප්‍රත්‍යාගණනයක් කිරීම අවශ්‍ය බව දක්වා තිබුණ ද, දැනට භාවිතා කරන සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති පිරිවැය රු.28,378,715ක් වන මෝටර් රථ 8ක් හා පිරිවැය රු.6,728,057 ක් වටිනා අයිතම 665ක් ප්‍රත්‍යාගණය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 4.8 යටතේ සේවක ප්‍රතිලාභ (පාරිතෝෂිත දීමනා) ගණනය සිදු කරන ලද්දේ "Project Unit Credit Method" අනුව බව සඳහන් කර තිබුණ ද, සමාගම විසින් සේවක පාරිතෝෂිත ගණනය කර තිබුණේ පාරිතෝෂිත සූත්‍ර ක්‍රමය (Formula Method) අනුවය.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 16 ඡේදය ප්‍රකාරව වත්කම කළමණාකාරිත්වය විසින් අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාකරවිය හැකි තත්ත්වයට ගෙන ඒමට සෘජුව අදාල කළ හැකි පිරිවැය, පිරිවැය මූලිකාංග ලෙස සැලකිය යුතු වුවත්, වගවත්ත නැවත පිරවුම් ඒකකයේ (Wagawaththa Refilling Unit) ඉදි කිරීම් කටයුතු සඳහා උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් වර්ෂය තුල දරන ලද රු.1,345,119ක වියදම වත්කමක් ලෙස හඳුනා නොගෙන වර්ෂයේ වියදමක් ලෙස කපා හැර තිබුණි. එම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.1,345,119කින් අඩු වී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) වගවත්ත ක්ලෝරීන් නැවත පිරවුම් ඒකකය මඟින් සිදු කරන බ්ලීචින් දියර හා කොස්ටික් සෝඩා දියර නිෂ්පාදනයට හා ක්ලෝරීන් සිලින්ඩර වලට පිරවීමේ දී දැරීමට සිදුවන සියළු වියදම් නිෂ්පාදන පිරිවැයට ඇතුලත් විය යුතු වුවත් සමහර වියදම් පරිපාලන වියදම් තුලට ඇතුලත් කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| 2003 ජූනි 3 දිනැති පීඊඞී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.3 වගන්තිය | 2015 සිට 2019 දක්වා වන වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ

ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) කළුතර ෆුලර්ටන් කර්මාන්තපුරයේ පරන්තන් කෙමිකල්ස් ආයතනයට අයත් අක්කර 2 කින් යුත් ඉඩමේ වර්ග අඩි 5250 කින් යුත් කාර්යාලීය දෙමහල් ගොඩනැගිල්ලේ පහළ මහලේ නිලධාරීන් තිදෙනෙකු පමණක් සිටින අතර සියළු පහසුකම් සහිත උඩුමහල ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ආ) 1986 වසරේ සිට පරන්තන් නිෂ්පාදනාගාරයේ ක්ලෝරීන් නිෂ්පාදනය නවතා දැමීම හේතුවෙන් මෙරටට අවශ්‍ය කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් මුළුමනින්ම 'ආනයනය මඟින් සපුරාගෙන තිබුණි. පරන්තන්හි පිහිටා ඇති අක්කර 227 ක භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ යෝජනා කර තිබූ අතර 2020 වර්ෂයේදී ශක්‍යතා අධ්‍යයනයක් හා පරිසර බලපෑම් තක්සේරුවක් කර ඒ වෙනුවෙන් පිළිවෙලින් රු.7,611,111 ක හා රු.2,116,750 ක වියදම් දරා තිබුණද යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි. එසේම 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු.3,670,855ක් වැයකර ශාක වගාකර තිබුණි.

(ඇ) කෝස්ටික් සෝඩා භාවිතා කරන්නන් බොහෝ දෙනෙක් කෝස්ටික් සෝඩා පතුරු දියකර හැරීමේ දුෂ්කර ස්වභාවයට මුහුණ දෙන බැවින්, දියර ආකාරයෙන් කෝස්ටික් සෝඩා මිලදී ගැනීමට කැමැත්තක් දක්වන බවද, කෝස්ටික් සෝඩා භාවිතා කරන්නන් සියයට 30 සිට සියයට 50 දක්වා විවිධ සාන්ද්‍රණයන්ගෙන් යුත් කෝස්ටික් සෝඩා ලයි භාවිතා කරන කරන බවද දක්වමින් දේශිය වෙළඳපොලේ කෝස්ටික් සෝඩා ලයි සඳහා ඇති ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, කොස්ටික් සෝඩා වලට වටිනාකමක් එකතු කිරීම හා පරන්තන් කෙමිකල්ස් ආයතනයට දැනට ලබාගත නොහැකි වෙළඳපල වෙත ළඟා වීමේ අරමුණින් කෝස්ටික් සෝඩා දියර සෑදීමේ ව්‍යාපෘතිය 2015 දෙසැම්බර් 30 දින කළුතර නාගොඩ කර්මාන්තපුරයේ ආරම්භ කර 2016 අප්‍රේල් 25 දින වැඩ අවසන් කර තිබුණි.

එසේ වුවද මෙම කෝස්ටික් සෝඩා දියර සකසන යන්ත්‍රය යකඩ වලින් සාදා තිබීම නිසා යකඩ හා කෝස්ටික් සෝඩා දියර ප්‍රතික්‍රියා කර යකඩ කෝස්ටික් සෝඩා ලයි සමඟ මිශ්‍ර වී ඒවා අලෙවි කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. මෙම කෝස්ටික් සෝඩා දියර යන්ත්‍රය සැකසීමට පෙර කෝස්ටික් සෝඩා පතුරු සමඟ යකඩ මිශ්‍ර වන බව අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා ආයතනයට රු. 2,089,000 ක අලාභයක් සිදු වී තිබුණි. මෙම යන්ත්‍රය භාවිතා නොකිරීම හේතුවෙන් මළ බැඳීම් වලට ලක් වී තිබූ අතර සමහර කොටස් එම භූමියේ තැන තැන දමා දිරාපත්ව වල් බිහි වී තිබුණි. එසේම එම

යන්ත්‍රය ගබඩා කර ඇති ගොඩනැගිල්ලද කිසිදු කාර්යයකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) වසා දමා ඇති ආයතන 5කින් අයවිය යුතු රු.4,579,926ක් වූ ණය ශේෂ අයකර ගැනීමට හෝ අවශ්‍ය අනුමැතීන් ලබාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තවමත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ආයතන වෙතින් අයවිය යුතු ලෙස ගිණුම්වල දක්වා ඇති වසර 10කට වඩා පැරණි රු.5,052,627 ක් වූ ශේෂයන් අයකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තාව (Progress Report) ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ඉදිරිපත් කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් ව්‍යාපෘති 07 ක් මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම පරන්තන්හි පිහිටා ඇති භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා කුඩා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම හා වගවත්ත ක්ලෝරීන් ගබඩා සංකීර්ණ කටයුතු සිදු කිරීම යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂයේ සිදුකර ඇතත් ඒවා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) පරන්තන් කෙමිකල්ස් සමාගමේ අනුමත කාර්යය මණ්ඩලය 70 ක් වූ අතර සත්‍ය කාර්යය මණ්ඩලය 55 ක් විය. ඒ තුල ඇතුලත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා විගණක යන තනතුරු 2019 වර්ෂයේ සිටද, සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර 2013 වර්ෂයේ සිටද, පුරප්පාඩුව පැවතියද 2021 ඔක්තෝබර් 30 දින දක්වා අදාල තනතුරු පිරවීමට සමාගම කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## 2020 දෙසම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|---|
| **ආදායම** | 1 | 306,585,103 | 287,168,845 |
| විකුණුම් පිරිවැය | 2 | (152,926,005) | (151,904,349) |
| දළ ලාභය | | 153,659,098 | 135,264,496 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 3 | 33,032,969 | 38,477,530 |
| **වියදම්** | | | |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | | (615,044) | (1,494,595) |
| පරිපාලන සහ ආයතන වියදම් | | (103,994,475) | (98,614,771) |
| | | (104,609,519) | (100,109,366) |
| මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන ලාභය | 4 | 82,082,547 | 73,632,660 |
| අඩු කලා : මූල්‍ය වියදම් | | (52,808) | (251,933) |
| බදු පූර්ව ලාභය | | 82,029,740 | 73,380,727 |
| අඩු කලා : බදු අය කිරීම | 5 | (55,347,595) | (30,192,565) |
| බදු ගෙවීමට පසු ශුද්ධ ලාභය | | 26,682,144 | 43,188,162 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| තත්‍ය අලාභය | | 524,120 | 471,756 |
| විස්තීර්ණ ආදායම් මත ඇති වන බදු වගකීම | | (73,377) | (66,046) |
| **වර්ෂය සඳහා මුලු විස්තීර්ණ ආදායම** | | 27,132,887 | 43,593,872 |
| කොටසකට ඉපැයීම (රු.) | 6 | 6.78 | 10.90 |
| කොටසකට ලාභාංශය (රු.) | 7 | - | 0.75 |

## 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| වත්කම් | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ | 8 | 267,790,774 | 288,300,442 |
| පෙරගෙවුම් බදු ඉඩම | | 2,670,950 | 2,785,739 |
| කෙරීගෙන යන වැඩ | | 19,085,178 | 7,994,545 |
| | | 289,546,903 | 299,080,545 |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ තොගය | 9 | 19,975,939 | 25,480,229 |
| වෙළඳ හා වෙනත් ලැබීම් | | 54,128,890 | 46,820,411 |
| කාර්ය මණ්ඩල සහ වෙනත් ණය ගැතියන් | | 19,130,028 | 20,871,012 |
| තැන්පතු, පූර්ව ගෙවීම් හා අත්තිකාරම් | | 5,550,074 | 5,225,562 |
| කෙටි කාලීන ආයෝජන | 10 | 449,346,806 | 387,807,350 |
| මුදල් සහ මුදල් හා සමාන දේ | | 26,041,673 | 8,605,086 |
| **මුළු ජංගම වත්කම්** | | 574,173,410 | 494,809,650 |
| **මුළු වත්කම්** | | 863,720,313 | 793,890,376 |
| **ස්කන්ධ මූල ධනය සහ බැරකම්** | | | |
| **මූල ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත මූල ධනය | 11 | 40,000,000 | 40,000,000 |
| රඳවා ගත් ලාභය | | 420,024,309 | 401,364,772 |
| වෙනත් ස්කන්ධ මූල ධන අයිතමයන් | 12 | 219,195,490 | 220,795,490 |
| | | 679,219,799 | 662,160,262 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 13 | 12,009,340 | 11,028,082 |
| විලම්බිත බදු | 14 | 103,274,179 | 61,091,783 |
| | | 115,283,519 | 72,119,865 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ ණය හිමියන් සහ අනෙකුත් ගෙවීම් | | 55,993,823 | 50,464,039 |
| ජංගම බදු බැරකම් | | 10,738,576 | 8,539,837 |
| බැංකු අයිරා | | 2,484,595 | 606,373 |
| **මුළු ජංගම බැරකම්** | | 69,216,994 | 59,610,248 |
| **මුළු ස්කන්ධ මූල ධනය සහ බැරකම්** | | 863,720,313 | 793,890,376 |

මෙම මූල්‍ය වාර්තා 2007 වර්ෂයේ සමාගම් පනතේ අංක 7 වගන්තිවලට අනුකූලව සැකසී ඇති බවට සහතික කරමි.

**මූල්‍ය අංශ ප්‍රධානී**

මෙම මූල්‍ය ප්‍රකාශනයන් සැකසීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ.
මෙම මූල්‍ය ප්‍රකාශනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

**සභාපති** **අධ්‍යක්ෂ**

අංක 25 සිට 35 දක්වා පිටුවල දැක්වෙන විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය වාර්තාව හා බැඳුණු කොටස් වේ.

## 2020 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ මූල ධනයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

| | ප්‍රකාශිත මූල ධනය<br>රු. | ප්‍රාග්ධන සංචිතය<br>රු. | වෙනත් ස්කන්ධ මූලධන අයිතමයන්<br>රු. | සමුච්චිත ලාභය/ (පාඩුව)<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 40,000,000 | - | 220,795,490 | 357,770,900 | 618,566,390 |
| ලාභාංශ ගෙවීම් | - | - | - | - | - |
| | - | - | - | - | - |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 43,593,872 | 43,593,872 |
| පෙර ගැලපීම් | | | | - | - |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | 40,000,000 | - | 220,795,490 | 401,364,772 | 662,160,262 |
| 2020 ජනවාරි 01 දිනට ශේෂය | 40,000,000 | | 220,795,490 | 401,364,772 | 662,160,262 |
| පෙර වසර සම්බන්ධයෙන් ගැලපීම් | - | - | - | (73,350) | (73,350) |
| ලාභාංශ ගෙවීම් | - | - | - | (10,000,000) | (10,000,000) |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | 27,132,887 | 27,132,887 |
| පෙර ගැලපීම් | | | (1,600,000) | (1,600,000) | |
| 2020 දෙසැම්බර් 31 දිනට නැවත ප්‍රතිෂ්ඨාපනය කල ශේෂය | 40,000,000 | - | 219,195,490 | 420,024,309 | 679,219,799 |

## 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| බදු පූර්ව ශුද්ධ ලාභය | | 82,029,740 | 73,380,727 |
| **<u>ගැලපුම්</u>** | | | |
| ක්ෂය ප්‍රතිපාදනය | | 21,172,167 | 20,433,802 |
| ක්‍රමක්ෂය | | 114,788 | 114,788 |
| පොලී ආදායම් | | (29,760,970) | (37,037,498) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය | | - | - |
| ප්‍රතිපාදන | | - | - |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 2,415,494 | 2,190,511 |
| කාර්ය මණ්ඩල ණය පොලී වියදම් | | 706,748 | 666,253 |
| **කාරක මූල ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | | 76,677,965 | 59,748,583 |
| වෙළඳ තොගයේ (වැඩි වීම)/අඩු වීම | | 5,504,290 | (887,229) |
| වෙළඳ සහ වෙනත් ලැබීම්වල (වැඩි වීම)/අඩු වීම | | (7,308,479) | 2,125,674 |
| කාර්ය මණ්ඩල සහ අනෙකුත් ණය ගැතියන්ගේ (වැඩි වීම)/අඩු වීම | | 1,740,984 | 578,723 |
| තැන්පතු පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්වල (වැඩි වීම)/අඩු වීම | | (324,512) | (1,406,298) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම්වල වැඩි වීම/(අඩු වීම) | | 5,529,784 | 8,993,905 |
| | | 5,142,067 | 9,404,775 |
| **කාරක මූල ධනය වෙනස් වීමට පසු මෙහෙයුම් ලාභය** | | 81,820,032 | 69,153,358 |
| ගෙවන ලද ආදායම් බදු | | (9,526,801) | (9,000,000) |
| ගෙවන ලද පාරිතෝෂික | | (847,116) | (3,623,443) |
| **මෙහෙයුම් කටයුතුවලින් ජනිත මුදල** | | 71,446,115 | 56,529,916 |
| **<u>ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය</u>** | | | |
| පොලී ආදායම් | | 25,577,836 | 34,677,447 |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ මිලට ගැනීම | | (662,496) | (31,699,548) |
| දේපල, යන්ත්‍රාගාර සහ උපකරණ විකිණීමෙන් ලත් මුදල | | 1,827,000 | - |
| කෙරීගෙන යන වැඩ | | (11,090,634) | 9,162,321 |
| **ආයෝජන කටයුතුවලින් ලද භාවිතා කැරුණු මුදල් ප්‍රවාහ** | | 15,651,707 | 12,140,221 |
| **<u>මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය</u>** | | | |
| ගෙවන ලද ලාභාංශ | | (10,000,000) | - |
| **මූල්‍ය කටයුතුවලින් ලද භාවිතා කැරුණු** මුදල් ප්‍රවාහ | | - | - |
| **මුදල් සහ මුදල් හා සමාන දේවල ශුද්ධ වැඩි / අඩු වීම** | | 77,097,822 | 68,670,137 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දේ** | | 395,806,063 | 327,135,926 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දේ** | **(අ සටහන)** | 472,903,885 | 395,806,063 |

| | | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **වර්ෂය අවසානයේ මුදල් සහ, මුදල් හා සමාන දෑ ශේෂය** | | | |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 49,199,869 | 45,808,605 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 55,941,508 | 52,203,327 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 14,508,260 | 13,508,230 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 7,561,654 | 7,016,211 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 14,840,265 | 13,769,796 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 14,882,633 | 13,856,798 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 14,539,450 | 13,476,808 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 15,426,412 | 14,314,470 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 14,838,242 | 13,768,229 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 7,570,403 | 7,023,148 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 10,000,000 | 7,871,072 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 13,675,199 | 12,701,926 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 13,721,420 | 12,775,626 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 14,051,884 | 13,067,592 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 13,224,295 | 12,335,585 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 13,404,873 | 12,302,741 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 25,609,622 | 23,475,295 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 38,094,923 | 35,115,470 |
| ස්ථාවර තැන්පතු | - මහජන බැංකුව | 23,709,618 | 22,088,944 |
| ස්ථාවර තැන්පතු | -ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 11,304,798 | 10,489,332 |
| ස්ථාවර තැන්පතු | - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 11,215,515 | 10,442,449 |
| ස්ථාවර තැන්පතු | - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,968,351 | 10,197,838 |
| ස්ථාවර තැන්පතු | -ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,932,613 | 10,197,838 |
| ස්ථාවර තැන්පතු | -ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,125,000 | - |
| ස්ථාවර තැන්පතු | -ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,000,000 | - |
| ස්ථාවර තැන්පතු | -ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,000,000 | - |
| | | 449,346,807 | 387,807,350 |
| මහජන බැංකුව- ආයතනික ශාඛාව | | (2,484,595) | (606,373) |
| මහජන බැංකුව-මුදල් වෙළඳපොළ | | 25,964,758 | 8,550,762 |
| ලංකා බැංකුව -ආයතනික ශාඛාව | | - | - |
| මහජන බැංකුව-බෝම්බුවල ශාඛාව | | 5,922 | 5,691 |
| මහජන බැංකුව-හොරණ ශාඛාව | | 6,022 | 5,798 |
| සම්පත් බැංකුව | | - | - |
| සුළු මුදල් - හොරණ | | 31,453 | 18,828 |
| සුළු මුදල් -ප්‍රධාන කාර්යාලය | | 29,273 | 17,097 |
| සුළු මුදල්- කළුතර | | 3,235 | 5,230 |
| තැපැල් ගාස්තු අග්‍රිමය | | 1,010 | 1,680 |
| | | 23,557,078 | 7,998,714 |
| | | 472,903,885 | 395,806,063 |

## 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. **සංස්ථාපිත තොරතුරු**

1.1 **වාර්තා කෙරෙන විෂය**

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් ආයතනය සීමිත වගකීම් සහිත සමාගමක් වන අතර එය ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කර පිහිටුවා ඇත. එහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 13, ශ්‍රී රාමනාදන් පාරේ, අංක 100/25 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.2 **අධ්‍යක්ෂවරු විසින් මූල්‍ය ප්‍රකාශනයන් අනුමත කිරීම**

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2021 අගෝස්තු 11 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දෙන ලදී.

1.3 **සේවක සංඛ්‍යාව**

වර්ෂය අවසානයේදී, සමාගමේ සේවක සංඛ්‍යාව **55** ක් විය. (2019 වර්ෂයේදී සේවකයන් **56**)

1.4 **ප්‍රධාන ක්‍රියාකාරකම් හා එහි අවශ්‍යතාව**

රසායන ද්‍රව්‍යයන් ආනයනය කර විකිණීම, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම විය. සමාලෝචිත මුදල් වර්ෂය තුලදී, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනස්වීම් සිදු වී නොමැත.

1.5 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව ආයතනයේ ගනුදෙනුවලට අදාළව සත්‍ය හා සාධාරණ තත්වයන් නිරූපණය වන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

1.6 **අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ඇතුලත් වන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ මූලධනයේ සිදු වූ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගිණුම් ප්‍රතිපත්ති ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට හා 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව සකස් කර ඇත.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තෙක් එම මූල්‍ය වර්ෂය ද ඇතුලත්ව සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ගිණුම් සකස් කර ඉදිරිපත් කර ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා ප්‍රථම වතාවට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව 2012 ජනවාරි 01 වන දින පටන් බලපැවැත්වෙන පරිදි ඉදිරිපත් කර ඇත. මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ පිළිබඳ මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සමගාමීව සකස් වී ඇත.

2. **මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමට යොදාගත් පදනම**

2.1 **වටිනාකම් මැනීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කර ඇති අතර නැවත ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් සඳහා හැර අනෙකුත් වත්කම් අයිතම සඳහා අත්පත් කර ගැනීම් පිරිවැය පදනම් කරගෙන සිදු කර ඇත.

2.2 **මූල්‍ය ප්‍රකාශන සඳහා භාවිතා කරන ලද විනිමය**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන සහ ආයතනයේ ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ භාවිතා වන විනිමය වන ශ්‍රී ලංකා රුපියල භාවිතා කර ඇත.

3. **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හී සිදු වූ වෙනස්කම්**

2011 ජනවාරි 01 වන දින ආරම්භක මූල්‍ය තත්ව ප්‍රකාශනය පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ලද ශ්‍රී ලංකා ගිණුම් වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාරීව අනුගමනය කර ඇත.

**සංසන්දනාත්මක අගයන්**

පෙර වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ඉදිරිපත් කිරීම් සඳහා ශ්‍රේණිගත කිරීම් අදාළ පරිදි සංශෝධනය කර වඩා යහපත් වාර්තාකරණයන් සඳහා මෙම වසර තුලදී නැවත ඉදිරිපත් කර ඇත.

3.2 **විශේෂිත ගිණුම් ඇස්තමේන්තු, තීරණ සහ උපකල්පනයන්**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම්, වගකීම්, ගිණුම් ඇස්තමේන්තු, ගිණුම්කරණ උපකල්පනයන් සිදු කිරීමට කළමණාකරණයට සිදු වේ. ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමේ දී අනාගත කාලපරිච්ඡේද පිළියෙල කරනු ලබන ඇස්තමේන්තු, තීරණ හා ඒවායේ පදනම් හා මූලාශ්‍ර සහ වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම්වලට ඉන් වන බලපෑම විමර්ශනයට ලක් කර ඇත.

**දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම**

දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම යටතේ සාධාරණ අගය ගිණුම්වල වාර්තා කරනු ලබන අතර ප්‍රත්‍යාගණන අතිරික්ත හිමිකම පිළිබ**ඳ** ප්‍රකාශනයේ දක්වා ඇත. වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු ස**ඳ**හා ස්වාධීන සහ විශේෂඥ තක්සේරුකරුවකු යොදවා වත්කම්වල සාධාරණ අගයන් 2010 දෙසැම්බර් 31 දිනට නිර්ණය කර ඇත.

**බදුකරණය**

සමාගම ආදායම් බද්දට, එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුව සකස් කිරීමේ දී වර්තමාන ආදායම් බද්ද, විලම්භිත බදු වෙන් කිරීම හා වෙනත් බදු වෙන් කිරීම සඳහා ගිණුම්කරණමය ගණනය කිරීම්, ඇස්තමේන්තු හා ගිණුම්කරණමය තීරණ ගිණුම් සඳහා ගලපා ඇත. ගිණුම් පිළියෙල කරනු ලබන අවස්ථාවන් හීදී නව ගිණුම්කරණ ප්‍රමිත සහ බදුකරණමය නිර්වචනයන් අතර අවිනිශ්චිතව පැවතිණ.

**ස්පාශ්‍ය වත්කම්වල අගය අවප්‍රමාණය වීම**

වත්කම් භාවිතයෙන් ජනනය කර ගත හැකි අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වඩා හොඳ ඇස්තමේන්තුව ඊට අදාළ අවදානම් හා ගලපා ස්පෘශ්‍ය වත්කම් තක්සේරු කර ඇත. මෙවැනි ඇස්තමේන්තු නිරන්තර වෙනස්කම්වලට භාජනය විය හැකි අතර එසේ අගය අඩු වීමෙන් අලාභයක් හඳුනා ගනී නම් අදාළ වර්ෂය තුලදී ලාභයට එරෙහිව කපා හරිනු ලැබේ.

4. **ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හී සාරාංශය**

4.1 **විදේශ වෙළෙඳ ගනුදෙනු**

විදේශ වෙළෙඳ ගනුදෙනු වටිනාකම් ගනුදෙනුවේ දිනට පවතින විනිමය අනුපාතයන් අනුව ගිණුම්ගත කරනු ලැබේ. විදේශ විනිමයන්ගෙන් කරන ලද මූල්‍ය වත්කම් ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකයන් යටතේ පරිවර්තනය කරනු ලැබේ. පෙර කාලපරිච්ඡේදයේදී මිලදී ගනු ලැබූ මූල්‍ය නොවන අයිතමයන් පරිවර්තනය කරනු ලබන දිනට පවතින අනුපාතිකයන් යටතේ පරිවර්තනය කරනු ලැබේ. විදේශ වෙළඳ ගනුදෙනු වාර්තාකරණයේදී ඇති වන විනිමය හුවමාරු ලාභ අලාභ ආදායමට ගලපනු ලැබේ.

4.2 **බදු**

**වර්තමාන බද්ද**

ආදායම් බදු වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපණය කරනු ලබන ලාභයට 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ දක්වා ඇති ගැලපීම් කිරීමෙන් පසු ගණනය කරනු ලැබේ.

**විලම්භිත බදු**

විලම්භිත බදුකරණය වගකීම් ක්‍රමය භාවිතා කර සිදු කරනු ලබන අතර වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන යන වටිනාකම්වල තාවකාලික වෙනස් වීම් වෙන් කිරීම සඳහා සිදු කරනු ලැබේ. වත්කම්වල ලියාහල ගිණුම්කරණ අගයට හා බදුකරණ ලියා හල අගය අතර වෙනසට සිදු කරන ලද ගණනය කිරීම, විශ්‍රාම ප්‍රතිලාභ වෙන් කිරීම සඳහා කරනු ලබන ගණනය කිරීමට ගලපා ඇත.

සියලුම පවත්වාගෙන යන අගයන් හී තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වෙන් කිරීම සිදු කරනු ලබන අතර හිලව් කිරීමට නොහැකි වූ බදුකරණ අලාභ ඉදිරියේදී බදුකරණ ලාභයෙන් ආවරණය කිරීම සඳහා ඉදිරියට ගෙන යනු ලබයි.

විලම්භිත බදු වත්කම් සෑම ශේෂ පත්‍ර දිනකදීම පසුවිපරමට ලක්කොට ඒවායින් ආවරණය කර ගත යුතු ප්‍රමාණ කොටස් හෝ සම්පූර්ණ වශයෙන් බදුකරණ ලාභයන්ගෙන් ආවරණය කරනු ලැබේ.

## 4.3 දේපල පිරියත හා උපකරණ

### නිර්ණය කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව සහ එම වත්කම භාවිතයෙන් ආයතනයට ඇති වන අනාගත ආර්ථික ප්‍රතිලාභ ගණනය කිරීමෙන් වත්කම්වල වටිනාකම් නිර්ණය කර ඇත.

### ගණනය කිරීමේ පදනම

දේපල පිරියත උපකරණයන්ගේ පිරිවැය හෝ තක්සේරුගත වටිනාකමෙන් එකතු වූ ක්ෂය වීම් සහ අගය අඩු වීම් අඩු කොට වටිනාකම් දක්වා ඇත. දේපල පිරියත උපකරණයන්ගේ අගය අඩු වීම සඳහා අදාළ හේතු සාධක ඇති වන අවස්තාවන්වලදී නිරන්තර විමර්ශනයට භාජනය කර අදාළ ගැලපීම සිදු කරනු ලබයි. දේපල පිරියත උපකරණ නැවත තක්සේරු කරන අවස්තාවලදී අදාළ භාණ්ඩයේ සියලුම වත්කම් අයිතම අගය තක්සේරුකරණයට ලක් කරනු ලබයි.

ප්‍රත්‍යාගණනය කරන ලද දිනට පැවති සමුච්චිත ක්ෂය අගයන් එකිනෙකට හිලව් කොට ලැබෙන ශුද්ධ අගය ප්‍රත්‍යාගණිත අගයන් අතර වෙනස ප්‍රත්‍යාගණිත අතිරික්තය ලෙස ගිණුම්වල වාර්තා කරයි. ප්‍රත්‍යාගණිත වත්කම් විකිණීමේ දී ඊට සම්බන්ධ සංචිතයන් රඳවා ගත් ලාභයන්ට මාරු කර ඇත

### නීතිප්‍රකාර පිළිගැනීම

දේපල භාණ්ඩ, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න නීති ප්‍රකාර ආදේශනය කිරීමෙන් පසු පිළිගැනීමට හෝ බැහැර කිරීමට හෝ මතු පිරිමැසුම් සඳහා ලැබෙන්නා වූ ප්‍රතිලාභ බලාපොරොත්තු විය හැක. නීති ප්‍රකාර පිළිගැනීම් නිසා සිදුවන ලාභ සහ පාඩු එම වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුලින් ඉදිරිපත් කර ඇත.

### වටිනාකම අඩුවීම

මූලික ක්‍රමය අනුව පිරිවැය හෝ මුලු දේපලවල ධාරිතාව, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න සහ නිදහස් ඉඩම් අතහැර, මෙම ගණන් හිලව් කපා හැරීම පිළිබඳව තක්සේරු කිරීම ආර්ථික වත්කම් අනුව සිදුවේ.

නැවත අගය කරන ලද වත්කම්වල වටිනාකම අඩු කිරීම කළ යුත්තේ ඉතිරි ජීවිත කාලය තුල අවශ්‍ය ආර්ථික වත්කම් එකිනෙක භාණ්ඩ උපයෝගී කර ගනිමිනි.

වටිනාකම අඩුවීම සිදුවන්නේ නව පිරිවැය එකතුවීම මත ඇතිවන පහත සඳහන් ක්‍රමය අනුවය.

| දේපළ | වාර්ෂික ගණන % |
|---|---|
| ගොඩනැගිලි | 05.00 |
| මෝටර් රථ | 25.00 |
| සිලින්ඩර් සහ / බහාලුම් | 12.50 |
| මෙවලම් /උපකරණ | 12.50 |
| කාර්යාල උපකරණ | 12.50 |
| ගෘහභාණ්ඩ + උපකරණ | 12.50 |
| යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර සූත්‍ර | 12.50 |
| පරගණක . උපාංග | 33.33 |
| පණිවිඩ හුවමාරු සහ සන්නිවේදන ආම්පන්න | 33.33 |
| පාපැදි | 12.50 |

4.4 **මූල්‍ය සාධනපත්‍රය - මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම**

**මූල්‍ය වත්කම්**

**මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම**

LKAS 39 අනුව විෂයන් වශයෙන් වර්ග කර ඇත්තේ මූල්‍ය වත්කම් ලාභ හෝ පාඩු අනුව, ණය පහසුකම් හා නැවත ලැබීම, ආයෝජනය කරන ලද මුදල් පරිණත වීම, මූල්‍ය වත්කම් විකිණීම සඳහා යෙදීම වශයෙනි. මූලික හඳුන්වාදීමේදී සමාගම තමන්ගේ මූල්‍ය වත්කම් අනුව වර්ගීකරණය ගැන නිශ්චය කරනු ලබයි.

සමාගමේ මූල්‍ය වත්කම්හි මුදල්, කෙටිකාලීන තැන්පතු, වාණිජ සහ අනිකුත් ලැබීම්, ණය පහසුකම් සහ අනිකුත් ලැබීම් ඇතුලත්ව ඇත.

**පසු ඇගයීම**

මූල්‍ය වත්කම් ඇගයීමේ දී ඔවුන්ගේ වත්කම් වර්ගීකරණය පහත සඳහන් ලෙස දැක්වේ

**ණය සහ ආපසු ලැබීම්**

ණය සහ ආපසු ලැබීම් යනු යම් කිසිවකින් නොලැබුණු මූල්‍ය වත්කම් ස්ථාවර හෝ නිර්ණය ගෙවීම් ලෙස ක්‍රියාකාරී වෙළඳපොලෙ හි දක්වා නොමැත. මූලික ඇගයීමෙන් පසු මෙවැනි මූල්‍ය වත්කම් එම මිලෙන් හිලව් කිරීමත්, සහ EIR ක්‍රමය බලපවත්වමින් පොලිය අඩුකිරීමත් සිදුවේ. හිලව් කිරීමේ මිල ගණන් බැලීමේ දී කිසියම් අඩුකිරීමක් හෝ වාරිකයක් ලබා ගැනීමේ දී හෝ සහ ගාස්තු හෝ මිලගණන් අඛණ්ඩව EIR හි කොටසක් වීමය. මෙම EIR හිලව් කිරීම මූල්‍ය ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශනයේ ඇතුලු කර ඇත. අපවය කිරීමේ දී ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශනයේ පිළිගත් දෙයක් හැටියට අඩංගු වී ඇත.

**මූල්‍ය වගකීම්**

**මූලික හඳුන්වාදීම සහ පසු ඇගයීම**

LKAS 39 හි අඩංගු මූල්‍ය වගකීම් වර්ගීකරණය කර ඇත්තේ ලාභය හෝ අලාභය, ණය දීම් සහ ණය ලබා ගැනීමත් ලෙසය. මූලික හඳුනාගැනීමේ දී මෙම වර්ගීකරණයන් මූල්‍ය වගකීම් ලෙස සමාගම හඳුනාගනියි.

මූලිකවම හඳුනාගත් සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම්, ණය දීම සහ ණය ගැනීම ක්‍රමානුකූලව ණය හිලවු කරනු ඇත. මෙයට අප්‍රමාදව ආරෝපණය කළ යුතු ගනුදෙනු අගයන් ඇතුලත් කර ඇත.

ගණන් හිලව් සහ අනිකුත් ගෙවීම් සමාගමේ මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ

4.5 **පරිලේඛන**

පරිලේඛන මිල කර ඇත්තේ, වටිනාකමට අඩු ලෙස සහ දළ මුදල් වීමේ අගයන් අනුවය. දළ මුදල් වීමේ වටිනාකම විකුණුම් තක්සේරු මුදලින් සමාප්තිය සඳහා යොදන පිරිවැය සහ විකිණීම සඳහා තක්සේරු කිරීමය.

4.6 **වාණිජ සහ අනෙකුත් ලැබීම්**

ණයකරුවන් සහ අනෙකුත් ලැබිය යුතු දේ වල මිල තක්සේරු කර දළ අධිගත ප්‍රතිපාදන අඩමාන ලැබීම ලෙස නම් කර ඇත.

අවලංගු හා අඩමාන ණය පහත සඳහන් කොන්දේසි අනුව පෙන්වා ඇත.

| | |
|---|---|
| වර්ෂ 1 - 2 | 25% |
| වර්ෂ 2 - 3 | 50% |
| වර්ෂ 3 කට වැඩි | 100% |

4.7 **මූල්‍ය සහ මූල්‍ය සමවල**

මූල්‍ය ප්‍රකාශනයේ ස්ථාපිතයේ අඩංගු වී ඇති බැංකුවේ ඇති මූල්‍ය ධනය, සහ අතේ රැඳී ඇති මූල්‍ය ධනය ප්‍රකාශනයේ ඇති වියදම් සඳහාත්, මූල්‍ය සහ මූල්‍ය ස්ථාපිතයේ ඇත්තේ මූල්‍ය සහ කෙටිකාලීන තැන්පතු අඩංගු වී ඇත.

### 4.8 පාරිතෝෂිකය සඳහා නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම අනුව සේවකයෙකුට විශ්‍රාම යන විට ලැබිය යුතු ප්‍රතිලාභ, සාමාන්‍යයෙන් ඔහු විශ්‍රාම යනවිට සේවය කල සේවා කාලය අනුව තීරණය වේ. සමාගම සේවකයෙකුට පාරිතෝෂික මුදලක් ගෙවීම ව්‍යවස්ථානුකූලව වන අතර, මෙම පාරිතෝෂික දීමනාව නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අනුව බව පිළිගත යුතුය. සමාගම මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයේ කරුණු ඇතුලත් කර ඇත. මෙම පාරිතෝෂිකය ලබා දීමේ දී මෙම ප්‍රතිලාභ සැලසුම අනුව ගණනය කිරීමේදී එම සැලසුම් අනුව පාරිතෝෂිකය ගණනය කරන්නේ ප්‍රක්ෂිප්ත වැය ඒකක අනුවය. මෙම කාල සීමාව තුල සිදුවන්නා වූ ලාභ හෝ අලාභ මෙම පාරිතෝෂික මුදල් ගෙවීමේ දී බලපානු ඇත.

**නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල**

මූල්‍ය ප්‍රකාශනයේ විස්තර සහිතව දායකත්වය ලබා දීම ඉහත සඳහන් ප්‍රකාශනයේ වැය කිරීමක් ලෙස උපයනු ලබන මූල්‍යයන්හි යටත් වේ.

### 4.9 වගකීම් සහ ගිවිසුමක ඇතුලත් නියෝග

ගලාඑන සම්පත් සහ ආර්ථික ප්‍රතිලාභ බැඳීම් හේතුකොට ගෙන පැරණි සිදුවීම් මත දැනට ඇති වී ඇති අවනතභාවය මත නිකුත් කර ඇති මූල්‍ය ස්ථාපිතයේ වගකීම් සහ ගිවිසුම් නියෝග ඇතුලත් කර ඇත.
ණය හිමියන් විසින් කරනු ලබන ඉල්ලුම් හෝ ශේෂය දක්වා ඇති දේවල් වර්තමාන වගකීම් ලෙසත් ලේඛන ශේෂ ලේඛන වලට වසරකට පසුව ඉදිරිපත් කරන විට ඒවා වර්තමානයට පෙර වගකීම් ලෙස ශේෂ පත්‍රය අනුව වර්ග කරනු ලැබේ.

### 4.10 වාර්තා කිරීමේ කාල පරිච්ඡේදයෙන් පසු සිදුවන සිදුවීම

මූල්‍ය පත්‍රිකා නිකුත් කිරීම සඳහා බලය පැවරීමේ දිනයෙන් අනතුරුව සිදුවන මනාප හෝ අවාසි සිදුවීම් වාර්තා කිරීමේ කාලයට පසුව හෝ වාර්තා කිරීමේ කාලය අවසානයේ දී සිදුවිය යුතුය.

මෙම වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවන සිදුවීම් ගැන සිතාමතා නිසි ලෙස සැකසුම් කර හෝ හෙළිදරව් කිරීමෙන් අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය පත්‍රිකා වල වෙනස් කිරීම් සිදුකළ හැක.

### 4.11 සිලින්ඩර් සඳහා ලබා ගත් තැන්පත් නැවත ගෙවීම

සමාගම විසින් නිකුත් කරන ලද සිලින්ඩර් සඳහා පාරිභෝගිකයින්ගෙන් නැවත ගෙවීමේ පදනම මත ලබා ගත් තැන්පතු සිලින්ඩර් බාර දීමෙන් පසු නැවත ගෙවනු ලැබේ. බෙදා හැරීම් නියෝජිත සමග ඇති ගිවිසුම අවලංගු කරන අවස්ථාවේදී, නැවත ලබාදෙන සිලින්ඩර් සඳහා නැවත ගෙවීම් කරන අතර, සමාගමට ලබා නොදෙන සිලින්ඩර් සඳහා ලබාගත් මුදල් සමාගමට සින්න වෙයි.

### 4.12 ආදායම පිළිගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිසා ආදායම ගැන පිළිගැනීමක් ඇති අතර, මේ අනුව ආදායම සහ හවුල් වියදම් ඇතිවීම හෝ ඇතිවීමට සිදුවීම නිසි පරිදි ස්ථිර කළ හැක. ආදායම නිසි පරිදි ගණනය කිරීමට හැක්කේ ලැබෙන්නා වූ ප්‍රතිෂ්ඨාව හෝ ලැබෙන්නා වූ දළ වාණිජ මට්ටම් සහ අගය එක්කල බදු, සමාගම තුල සිදුවන්නා වූ විකුණුම් බැහැර කිරීමෙන් පසුවය. පහත සඳහන් විශේෂ මිනුම් දණ්ඩක් ආදායම පිළිගැනීම සඳහා යොදනු ලැබේ.

**භාණ්ඩ විකිණීම**

භාණ්ඩ විකිණීමේ දී මෙම සමූහයේ කළමණාකාරිත්වය මෙම භාණ්ඩ ගැනුම්කරුට අයිතිය පැවරීමෙන් පසු එම භාණ්ඩ සඳහා හවුල් කර ගැනීමක් නොමැති බවත් මෙම භාණ්ඩ ගැන කිසිදු පාලනයක් නොමැති බවත් සනාථ වූ පසු මෙම ආදායම පිලිගනු ලැබේ.

**වෙළඳාම් ප්‍රමාණය සාධක කොට ඇති බදු**

වෙළඳාම් ප්‍රමාණය සාධක කොට ඇති බදු සඳහා අගය එකතු කල බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, යනාදී බදු නියම පරිදි ක්‍රමානුකූලව ගෙවනු ලැබේ.

**පොලී ආදායම**

සම්භාවී ක්‍රමය අනුස්ථිර පිරිවැය සහ මූල්‍ය පිරිවැයට ලැබෙන පොලිය වර්ග කිරීම තුල විකිණීම, පොලී ආදායම හෝ වියදම වාර්තාගත කිරීම අනුව ප්‍රබල පොලී අනුපාතය (EIR) මෙය අනුව මෙමගින් අනාගත මූල්‍ය ගෙවීම් හෝ ලැබීම්, මූල්‍ය පිරිවැය කාලයට අනුව හෝ කෙටි කාලයකට, සරිලන ලෙස දළ ආදායම හෝ වගකීමයි. පොලී ආදායම මූල්‍ය ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පෙන්වා ඇත.

**ලාභ සහ අලාභ**

සම්පීඩන ආදායම් ප්‍රකාශනයේ ලාභ සහ අලාභ ලෙස ස්වභාවයෙන් නැගී එන්නේ දේපල, යන්ත්‍ර සහ ආම්පන්න සහ අනිකුත් අවලංගු වත්කම් සහ අනිකුත් තැන්පතු සමාගමේ විශේෂිත මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇත්තේ විකිණීමෙන් ලැබූ ආදායම අඩු කර එවන් වත්කම් වියදම් වලට යා කිරීමෙනි.

**අනිකුත් ආදායම්**

අනිකුත් ආදායම් සමාගණනය සාධක කොට හඳුනා ගැනීමට හැකිය.

4.13 **වියදම් හඳුනාගැනීම**

යම්කිසි භාණ්ඩයකින් ලැබෙන්නා වූ ආදායම සහ සෘජු පිරිවැය සමග ඇති සෘජු සහභාගිත්වය නිසා, විස්තර සහිත මූල්‍ය ප්‍රකාශනයේ වියදම හඳුනා ගැනීමට හැකිය.

මෙම විස්තර සහිත ප්‍රකාශනයට සමාගම සඳහා යන වියදම, දේපල නඩත්තු කිරීම, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න කාර්යක්ෂම ලෙස භාවිතය යන වියදම් සියල්ල මෙම ප්‍රකාශනයට ඇතුලත් කොට ඇත.

5. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත** (SLFRS/LKAS) **නිකුත් කර ඇති නමුත් තවමත් ක්‍රියාකාරී වී නැත.**

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පහත දක්වා ඇති නමුත් ප්‍රමිතීන් නිකුත් කර ඇතත්, ඒවා ක්‍රියාකාරී නොවන බව සහ ප්‍රකාශන නිකුත් කල දින දක්වා නොමැත. මෙම ප්‍රමිතීන් ලැයිස්තු ගත කිරීම සහ අර්ථනිරූපණ නිකුත් කිරීම් කර නොමැති අතර, සමාගම ඉදිරි දිනයකදී මෙය බලපානු ඇතැයි විශ්වාස කරනු ලබයි. සමාගමට මෙම ක්‍රියාවලිය බලපාන විට ඒවා නිසි පරිදි සම්මත කිරීමට පැහැදි සිටියි.

අ) SLFRS-9 මූල්‍ය ප්‍රකාශනඃ වර්ගීකරණය සහ ඇගයීම LKAS 39 විස්තර කර ඇති මූල්‍ය වගකීම් මූල්‍ය වත්කම් මැනීම සහ වර්ගීකරණය SLFRS 9 යන ඡේදයට පැවරෙන අතර ඒ ආකාරයෙන් සිදුවේ. මෙම මිනුම වාර්ෂිකව 2015 ජනවාරි 01 වන දින ආරම්භ වේ. සමාගමේ මූල්‍ය වත්කම්හි වර්ගීකරණය හා මිනුම් SLFRS 9 අනුව බලපාන අතර, එයින් මූල්‍ය වර්ගීකරණයකට හෝ වගකීමකට බලපානු නොලැබේ.

ආ) SLFRS 13 සාධාරණ මිල ඇගයීම - SLFRS 13 යටතේ තනි උපදේශකත්වයක් යටතේ මූලාශ්‍රයක් මත සාධාරණ මිලක් නියම කරයි.

6. SLFRS/LKAS **මූලික පිළිගැනීම**

SLFRS/LKAS අනුව පිළියෙල කරන ලද මුල්ම මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 31 වනදා අවසන් වන වර්ෂය සඳහාය. 2011 දෙසැම්බර් 31 දින අවසන් වන වර්ෂය සහ ඊට පෙර මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද්දේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව වන අතර එය 2011 දෙසැම්බර් මස 31 වන දා තෙක් බලපායි.

මේ අනුව සමාගම විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS 2011 දෙසැම්බර් 31 සඳහා එලෙස අනුකූලව බලපාන ලෙසත් එම SLFRS/LKAS ප්‍රමිතිවලට යටත් වන ලෙසත්, 2012 දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය විග්‍රහ කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුවය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සමාගමේ මුල් ප්‍රකාශන පළියෙල කර ඇත්තේ 2011 දෙසැම්බර් 31 වන දිනට වන අතර සමාගම සංක්‍රමණය වී ඇත්තේ 2011 ජනවාරි 01 වන දින පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ දීය. මෙම පත්‍රිකාවෙන් සමාගම විසින් කරන ලද අනුකූලනය නැවත ප්‍රකාශ කිරීම හෝ ප්‍රසිද්ධ කරන ලද 2011 දෙසැම්බර් 31 වන දින SLAS මූල්‍ය ප්‍රකාශන සමඟ සම්බන්ධ බවයි.

7. **ගිවිසුම් කෙරෙහි අධ්‍යක්ෂවරුන් දක්වන උනන්දුව**

සමාගම සමඟ ගිවිසුම් සඳහා ඔහුට උනන්දුවක් නොමැති බව නිසි බලධාරියා විසින් තහවුරු කළේය.

## ගිණුම් සඳහා සටහන්
## 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

| | | | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|---|
| **1** | **ආදායම** | | | |
| | විකුණුම් | | 306,585,103 | 289,083,702 |
| | අඩු කරන්න : ජාතිය ගොඩනැගීමේ බද්ද | | - | (1,914,857) |
| | | | 306,585,103 | 287,168,845 |
| **2** | **විකුණුම් පිරිවැය** | | | |
| | ආරම්භක තොගය | | 13,456,986 | 13,194,446 |
| | එකතු කරන්න : මිල දී ගැනීම් | | 146,426,023 | 152,166,888 |
| | | | 159,883,009 | 165,361,334 |
| | අඩු කරන්න : අවසාන තොගය | | (6,957,004) | (13,456,985) |
| | | | 152,926,005 | 151,904,349 |
| **3** | **අනෙකුත් මෙහෙයුම් ආදායම** | | | |
| | සේවක ණය සඳහා පොලිය | | 1,148,761 | 1,220,756 |
| | ස්ථාවර තැන්පතු, ඊක්ෂණ තැන්පතු සඳහා පොලිය | | 28,612,210 | 35,816,742 |
| | වෙනත් ආදායම් | | 1,445,000 | 1,440,033 |
| | ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | | 1,827,000 | - |
| | | | 33,032,969 | 38,477,530 |
| **4** | **මෙහෙයුම් ලාභය** | | | |
| | පහත දැක්වෙන වියදම් සඳහා අය කිරීමෙන් පසුව මෙහෙයුම් ලාභය දැක්වේ. | | | |
| | ක්ෂය ප්‍රතිපාදන | | 21,172,167 | 20,433,802 |
| | විගණක වේතනය | | 300,000 | 250,000 |
| | සේවක පිරිවැය (සටහන 4.1) | | - | - |
| | **4.1** | **සේවක පිරිවැය** | | |
| | | වැටුප්, වේතන සහ අනෙකුත් අදාළ වියදම් | 44,203,997 | 42,256,621 |
| | | සේවා අවසන් පාරිතෝෂිකය | 2,415,494 | 2,190,511 |
| | | සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල | 5,538,462 | 5,289,517 |
| | | | 52,157,953 | 49,736,649 |
| | | **පහත දැක්වෙන විස්තර ඉහත ඇතුලත් කර ඇත.** | | |
| | | සභාපතිතුමාගේ සහ විධායක අධ්‍යක්ෂතුමාගේ සංවේතන | 880,000 | - |
| | | අධ්‍යක්ෂ ගාස්තු | 612,000 | - |
| **5** | **බදුකරණය** | | | |
| | **වර්තමාන ආදායම් බද්ද** | | | |
| | සාමාන්‍ය කටයුතු පදනම් කරගෙන වර්තමාන බදු | **සටහන 5.1** | 13,238,576 | 11,302,813 |
| | විලම්භිත ආදායම් බදු ගාස්තුව / (ආපසු හැරවීම) | **සටහන 5.2** | 42,109,019 | 18,889,752 |
| | | | 55,347,595 | 30,192,565 |

| | 2020<br>රු | 2019<br>රු |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| **5.1** | **ගිණුම් ලාභය සහ බදු ලාභය සංසන්දනය කිරීම** | | |
| | ගිණුම් අනුව ශුද්ධ ලාභය | 82,029,740 | 73,380,727 |
| | අවසර දිය නොහැකි වියදම්වල එකතුව | 25,682,366 | 23,195,152 |
| | | 107,712,106 | 96,575,879 |
| | අවසර දිය හැකි වියදම්වල එකතුව | (42,911,457) | (52,212,748) |
| | ව්‍යාපාර ලාභය | 64,800,649 | (44,363,131) |
| | පොලී ආදායම | 29,760,611 | 36,371,245 |
| | සම්පූර්ණ ව්‍යාස්ථාපිත ආදායම | 94,561,260 | 80,734,376 |
| | බදු ලාභය | 13,238,576 | 11,302,813 |
| | | 13,238,576 | 11,930,470 |
| **5.2** | **විලම්බිත බදු වියදම් / (ආදායම)** | | |
| | කාල වෙනස් වීම හේතුවෙන් කල්තැබීමට සිදු වූ බදු වියදම් | 42,182,396 | 18,955,798 |
| | **සංසන්දනාත්මක ආදායමෙන් ලද බදු** | (73,377) | (66,046) |
| | | 42,109,019 | 18,889,752 |

## 6 කොටසකට ඉපැයීම්

**6.1** කොටසකට මූලික ඉපැයීම් ගණනය කෙරෙන්නේ එම වර්ෂය තුල නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍යය තුලින්, සාමාන්‍යය කොටස් හිමියන්ට අයත් සේ සැලකෙන අදාළ වර්ෂය සඳහා ශුද්ධ ලාභය බෙදා දීමෙනි. ප්‍රසාද දීමනා ප්‍රශ්නයක් වැනි, සම්පත්වල අනුරූප වෙනසක් නොමැතිව නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වෙනස් කිරීම්වලට භාජනය කෙරුණු සිදුවීම් සඳහා මෙම වර්ෂය තුල සහ පූර්ව වර්ෂය තුල නොගෙවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍යය ගලපනු ලැබේ.

**6.2** 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටස් ගණනය කිරීමක මූලික ඉපැයීම්වලදී භාවිතා කෙරුණු ආදායම සහ කොටස් දත්ත පහත පෙන්නුම් කෙරේ.

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **ලවයන් වශයෙන් උපයෝගි කළ ප්‍රමාණය** | | |
| ශුද්ධ ලාභය / (පාඩුව) | 27,132,887 | 43,593,872 |
| කොටසකට ඉපැයීම් වෙනුවෙන් සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් සේ සැලකෙන ශුද්ධ ලාභය | 27,132,887 | 43,593,872 |
| **හරයන් වශයෙන් උපයෝගි කෙරුණු සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | | |
| කොටසකට මූලික ඉපැයීම්වලට අදාළ නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ සාමාන්‍ය | 4,000,000 | 4,000,000 |
| | 4,000,000 | 4,000,000 |
| කොටසකට ඉපැයීම් | 6.78 | 10.90 |

## 7 කොටසකට ලාභාංශයන්

| | | |
|---|---|---|
| **ලවයන් වශයෙන් උපයෝගි කළ ප්‍රමාණය** | | |
| වර්ෂය සඳහා ලාභාංශය | - | 3,000,000 |
| **හරයන් වශයෙන් උපයෝගි කෙරුණු සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | | |
| කොටසක ලාභාංශවලට අදාළ ව නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් | 4,000,000 | 4,000,000 |
| කොටසක ලාභාංශ | - | 0.75 |

8 දේපළ, යන්ත්‍රගාර සහ උපකරණ

| වත්කම් විස්තර | පිරිවැය/තක්සේරුව | | | | ක්ෂයවීම් | | | | W.D.V | W.D.V |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශේෂය 01/01/2020 වන දිනට | වසර තුළ එකතු කිරීම් | බැහැර කිරිම | ශේෂය 31/12/2020 වන දිනට | ශේෂය 01/01/2020 වන දිනට | වසර සඳහා | බැහැර කිරීම මත | ශේෂය 31/12/2020 වන දිනට | ශේෂය 01/01/2020 වන දිනට | ශේෂය 31/12/2020 වන දිනට |
| ඉඩම් | 70,000,000 | - | - | 70,000,000 | - | - | - | - | 70,000,000 | 70,000,000 |
| ගොඩනැගිලි | 64,275,514 | - | - | 64,275,514 | 10,136,641 | 2,438,936 | - | 12,575,577 | 54,138,873 | 51,699,937 |
| යන්ත්‍රගාර සහ යන්ත්‍රාතෝපකරණ | 15,284,291 | - | - | 15,284,291 | 8,162,571 | 1,792,372 | - | 9,954,943 | 7,121,720 | 5,329,348 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 3,052,176 | - | - | 3,052,176 | 2,062,144 | 171,035 | - | 2,233,179 | 990,032 | 818,997 |
| කාර්යාල උපකරණ | 5,378,433 | 230,546 | - | 5,608,979 | 2,683,253 | 528,037 | - | 3,211,290 | 2,695,180 | 2,397,689 |
| පරිගණක | 4,739,233 | 408,050 | - | 5,147,283 | 3,955,543 | 485,919 | - | 4,441,462 | 783,690 | 705,821 |
| මෝටර් වාහන | 34,935,915 | - | (1,600,000) | 33,335,915 | 34,630,335 | 305,580 | (1,600,000) | 33,335,915 | 305,580 | - |
| කන්ටේනර් සහ සිලින්ඩර | 244,277,033 | - | - | 244,277,033 | 92,753,359 | 15,295,715 | - | 108,049,074 | 151,523,674 | 136,227,959 |
| මෙවලම් සහ උපකරණ | 1,332,188 | - | - | 1,332,188 | 611,916 | 134,578 | - | 746,494 | 720,272 | 585,694 |
| සන්නිවේදන සහ වෛද්‍ය උපකරණ | 456,598 | 23,900 | - | 480,498 | 435,175 | 19,993 | - | 455,168 | 21,423 | 25,330 |
| | 443,731,381 | 662,496 | (1,600,000) | 442,793,877 | 155,430,937 | 21,172,166 | (1,600,000) | 175,003,103 | 288,300,444 | 267,790,774 |

| | | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| 9 | **පවතින භාණ්ඩ තොග** | | |
| | දියර ක්ලෝරීන් - කි. ග්‍රෑ. 900 | 5,231,474 | 8,698,778 |
| | දියර ක්ලෝරීන් - කි. ග්‍රෑ. 68 | 410,865 | 218,374 |
| | කෝස්ටික් සෝඩා | 1,213,165 | 2,200,716 |
| | හයිඩ්‍රොක්ලෝරික් අම්ලය | - | 1,339,118 |
| | බ්ලීච්ං දියර | 101,500 | |
| | | 6,957,004 | 13,456,986 |
| | වෙනත් තොග | | |
| | ක්ලෝරීන් වෑල්ව් - ස්පින්ඩ්ල්ස්, වොෂස්, ප්‍රොටෙක්ටර්ස්, ස්පැනර්ස් සහ වෑල්ව්ස් කම්ප්ලීට් | 13,018,935 | 12,023,243 |
| | ප්‍රොටෙක්ටිව් හුඩ්ස් | - | - |
| | හදිසි අවස්ථා උපකරණ කට්ටලය | - | - |
| | ලිපි ද්‍රව්‍ය | - | - |
| | | 13,018,935 | 12,023,243 |
| | | 19,975,939 | 25,480,229 |
| 10 | **කෙටි කාලින ආයෝජන** | | |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 49,199,869 | 45,808,605 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 55,941,508 | 52,203,327 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 14,508,260 | 13,508,230 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 7,561,654 | 7,016,211 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 14,840,265 | 13,769,796 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 14,882,633 | 13,856,798 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 14,539,450 | 13,476,808 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 15,426,412 | 14,314,470 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 14,838,242 | 13,768,229 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 7,570,403 | 7,023,148 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 10,000,000 | 7,871,072 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 13,675,199 | 12,701,926 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 13,721,420 | 12,775,626 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 14,051,884 | 13,067,592 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 13,224,295 | 12,335,585 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 13,404,873 | 12,302,741 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 25,609,622 | 23,475,295 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 38,094,923 | 35,115,470 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 23,709,618 | 22,088,944 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 11,304,798 | 10,489,352 |
| | ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | 11,215,515 | 10,442,449 |
| | ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,968,351 | 10,197,838 |
| | ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,932,613 | 10,197,838 |
| | ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,125,000 | - |
| | ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,000,000 | - |
| | ස්ථාවර තැන්පතු - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 10,000,000 | - |
| | | 449,346,806 | 387,807,350 |

**11 ප්‍රකාශිත මූල ධනය**

**සමන්විත වන්නේ**

දැක්වෙන පරිදි මූල ධන සංචිතය

| | | |
|---|---|---|
| 4,000,000 සාමාන්‍ය කොටස් සටහන 11.1 | 40,000,000 | 40,000,000 |
| | 40,000,000 | 40,000,000 |

**12 හිමිකම්වල වෙනත් සංරචක**

**දේපළ යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණවල ප්‍රත්‍යාගණන සංචිත**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 219,195,490 | 220,795,490 |
| වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනයේ අතිරික්ත | | |
| නැවත ඇගයීම ආපසු හැරවීම | | |
| වර්ෂ අවසානයේ ශේෂය | 219,195,490 | 220,795,490 |

2010.12.31 දිනට දේපළ පිරියත හා උපකරණයන්හි පැවති සාධාරණ වටිනාකම තීරණය කිරීම සඳහා සමාගම විසින් වර්ෂය තුළදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කටයුතු ඉටු කරවා ගෙන ඇත. 2010.12.31 දා සිට බලපැවැත්වෙන මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් වටිනාකම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් වටිනාකම් මත පදනම් වී ඇත.

| වත්කම් වර්ෂය | 2010.12.31 දිනට ශුද්ධ පවත්වාගෙන යන අගය රු. | 2010.12.31 දිනට ප්‍රත්‍යාගණිත අගයන් රු. | ප්‍රත්‍යාගණිත සංචිත රු. |
|---|---|---|---|
| ඉඩම | 538,000 | 70,000,000 | 69,462,000 |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ | 181,790 | 1,138,000 | 956,210 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 1,208,140 | 1,925,000 | 716,860 |
| කාර්යාල උපකරණ | 461,909 | 1,511,700 | 1,049,791 |
| පරිගණක උපාංග | 741,648 | 916,850 | 175,202 |
| මෝටර් වාහන | 192,128 | 12,195,037 | 12,002,909 |
| පා පැදි | 1 | 2,500 | 2,499 |
| සිලින්ඩර | 36,892,075 | 173,033,000 | 136,140,925 |
| ආවුද සහ උපකරණ | 30,216 | 319,310 | 289,094 |
| | 40,245,907 | 261,041,397 | 220,795,490 |

**13 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම**

**පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**

| | | |
|---|---|---|
| 2020.01.01 දිනට ශේෂය | 11,028,082 | 12,932,769 |
| ප්‍රතිපාදන යටතේ | - | - |
| වර්ෂය තුල ගෙවීම් | 945,259 | 955,425 |
| වර්ෂය තුල පොලී ආදායම | 1,407,235 | 1,235,087 |
| සන්සන්දනාත්මක ආදායම් ප්‍රකාශ සඳහා වෙන් කිරීම | 13,380,576 | 15,123,281 |
| වෙනත් සන්සන්දනාත්මක ආදායම් ප්‍රකාශ සඳහා වෙන් කිරීම තත්‍ය අලාභය | | |
| පාඩුව | (524,120) | (471,756) |
| අඩු කලා - වර්ෂය තුළදී මුදලින් ගෙවීම් | (847,116) | (3,623,443) |
| වර්ෂය අවසානයේ ශේෂය | 12,009,340 | 11,028,082 |

**13.1** 2015.12.31 දිනට නිර්වචිත ප්‍රතිලාභ වගකීම් වටිනාකම් නිර්ණය කිරීම සඳහා යොදා ගත් මූලික පරාමතික පහත පරිදි වේ.

| | 2020 | 2019 |
|---|---|---|

| | | |
|---|---|---|
| වට්ටම් ප්‍රතිශතය | 12% | 12% |
| වාර්ෂික වැටුප් වර්ධක ප්‍රතිශතය | 10% | 10% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම | 5% | 5% |

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| **14 විලම්භිත බදු** | | |
| 2020.01.01 දිනට ශේෂය | 61,091,783 | 42,135,985 |
| වර්ෂයේ මාරු කිරීම් | 42,182,396 | 18,955,798 |
| 2020.12.31 දිනට ශේෂය | 103,274,179 | 61,091,783 |

**15 අසම්භාව්‍ය වගකීම්**

ප්‍රමාණාත්මකව සැලකිය යුතු කිසිදු අසම්භාව්‍ය වගකීමක් ශේෂ පත්‍රයට පැමිණ නැත.

**16 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ගැලපීම් හෝ අනාවරණය කිරීම් සඳහා අවශ්‍ය වන සිද්ධි කිසිවක් ශේෂ පත්‍ර දින සිට මෙම වාර්තාවේ දිනය දක්වා පැන නැගී නැත.

**17 හෙළිදරව් කිරීම්**

**නැවත පිරවීමේ ක්‍රියාවලිය**

වර්ෂය තුලදී කළුතර නාගොඩ නැවත පිරවුම් ඒකකයේ සිදු වූ ක්ලෝරීන් කාන්දුව නිසා අදාළ නැවත පිරවීමේ කාර්යය වගවත්ත කර්මාන්ත ඒකකයේ පිහිටි නව ස්ථානයකට මාරු කිරීමට සිදු විය. මේ සඳහා රු මිලියන 7.2 මුදලක් වැය විය. මෙම ස්ථානයේ සිදු වූ වෙනස නිසා දළ වශයෙන් වූ ලාභය අඩුවීමට මින් බලපෑමක් ද ඇත.

**18 කොටසක ලාභාංශය**

දෙසැම්බර 31 න් අවසන් වර්ෂය සඳහා

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| ප්‍රකාශිත අවසන් ලාභාංශය | - | 3,000,000 |
| සාමාන්‍ය කොටස් අනුව සංඛ්‍යාව | 4,000,000 | 4,000,000 |
| කොටසක ලාභාංශය | | 0.75 |

## ආයතනික සැලැස්ම - උපායමාර්ගික ව්‍යාපාරික ඒකකය

උපායමාර්ගික ව්‍යාපාරික අංශ




උපායමාර්ගික ඉලක්ක

පාර්ශවකරුවන් / සේවාවන්

- ජල පිරිපහදු ක්‍රියාවලිය
- රබර් ආශ්‍රිත නිෂ්පාදන
- සබන් සහ විෂබීජ නාශක නිෂ්පාදනය
- රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය
- පිහිනුම් තටාක පවිත්‍රකාරක රසායනිකයන් සැපයීම
- බීම සහ ආහාර ඇසුරුම් පිරිසිදුකරණය
- කඩදාසි නිෂ්පාදන ක්‍රියාවලිය
- ගැල්වනයිස් කර්මාන්තය
- ඉන්දියානු, පාකිස්තාන සහ බංග්ලාදේශ සැපයුම්කරුවන් හවුල්කරුවන්

## සංවිධාන ව්‍යුහය


සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)
සහාකාර සාමාන්‍යාධිකාරී (පරිපාලක)
සහාකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්)
සහාකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
සහාකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)
සහාකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)
පරිපාලක නිලධාරි
ගබඩා නිලධාරි
සැපයුම් නිලධාරි
ගිණුම් නිලධාරි
අලෙවි නිලධාරි
තාක්ෂණික නිලධාරි
කළමණාකාර සහකාර
ප්‍රධානියා
රියැදුරු සහ කාර්යාල ආධාර
කාර්යාල ආධාර

## 2019,2020 වසර සඳහා මෙහෙයුම් සහ මූල්‍ය දත්ත සහ 2021 වසර සඳහා අයවැයගත සංඛ්‍යා

2019 , 2020 වසර සඳහා මෙහෙයුම් සහ මූල්‍ය දත්ත සහ 2021 වසර සඳහා අයවැයගත සංඛ්‍යා

| | 2019<br>සත්‍ය<br>රු.'000 | 2020<br>අයවැය ගත<br>රු.'000 | 2021<br>සත්‍ය<br>රු.'000 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | 299,081 | 289,547 | 549,030 |
| **ජංගම වත්කම්** | 494,810 | 574,173 | 375,000 |
| **මුලු වත්කම්** | 793,890 | 863,720 | 924,030 |
| **ස්කන්ධ මූල ධනය සහ බැරකම්** | | | |
| **මූල ධනය සහ සංචිත** | | | |
| **කොටස් හිමියන්ගේ පදනම** | 662,160 | 679,220 | 711,030 |
| **ජංගම නොවන වගකීම්** | 72,120 | 115,284 | 100,000 |
| **ජංගම වගකීම්** | 59,610 | 69,217 | 113,000 |
| **මුලු කොටස්, වගකීම්** | 793,890 | 863,720 | 924,030 |
| **ආදායම්** | 287,169 | 306,585 | 338,630 |
| **විකුණුම් පිරිවැය** | (151,904) | (152,926) | (141,658) |
| **දළ ලාභය/(පාඩුව)** | 135,264 | 153,659 | 196,972 |
| **අනෙකුත් මෙහෙයුම් ආදායම්** | 38,478 | 33,033 | 33,750 |
| | 173,742 | 186,692 | 230,722 |
| **මෙහෙයුම්වලින් ලැබෙන ලාභය/(පාඩුව)** | 73,633 | 82,083 | 115,800 |
| **බදු පූර්ව ලාභය/(පාඩුව)** | 73,381 | 82,030 | 115,500 |
| **බදු ගෙවීමට පසු ශුද්ධ ලාභය/(පාඩුව)** | 43,188 | 26,682 | 92,500 |
| **කොටසක ඉපයීම** | 10.80 | 6.67 | 23.13 |
| **කොටසක ලාභාංශ** | 0.75 | - | 5.00 |

## සමාගමේ කාර්ය සාධනය ඇගයීම

වර්ෂ 1975 පටන් කොළඹ 13, ශ්‍රී රාමනාදන් මාවතේ වරාය අධිකාරිය වෙතින් බදු පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක සිය ප්‍රධාන කාර්යාලය සහ කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ල ගබඩාව පවත්වාගෙන යනු ලබයි.

සමාගමේ ප්‍රධාන කාර්ය ලෙස රටේ සහ වෙළඳපොල අවශ්‍යතා අනුව ක්ලෝරින්, කෝස්ටික් සෝඩා සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ඉන්දියාව, බංග්ලාදේශය සහ පකිස්තානය වැනි රටවලින් ආනයනය කර විකිණීම හඳුන්වා දියහැක.

ක්ලෝරින් ගබඩා කිරීමේ කටයුත්ත ඉතා ආරක්ෂිතව ජනාකීර්ණ ප්‍රදේශවලින් බැහැරව කළ යුතු කටයුත්තක් බැවින් ඒ සඳහා කළුතර දිස්ත්‍රික්කයට අයත් හොරණ කර්මාන්තපුරයේ ගබඩාවක් පවත්වා ගෙන යනු ලැබීය.

හොරණ කර්මාන්තපුරයේ පවත්වා ගෙන යනු ලැබූ මෙම සිලින්ඩර් ගබඩා කිරීමේ කටයුත්ත නිසා අප ආයතනයට විශාල මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවීමට සිදු විය. මේ නිසා ආයතනය විසින් කරන ලද ඉල්ලීම සලකා බැලූ එවකට කර්මාන්ත සංවර්ධන ගරු අමාත්‍ය කුමාර වෙල්ගම මැතිතුමා ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුව, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන සංකල්පය ක්‍රියාවේ යොදවනු වස් 2006.11.22 වන දින කැබිනට් අනුමැතියෙන් කළුතර පුලර්ටන් කර්මාන්ත ඒකකයේ අක්කර 2 ක ඉඩම (ලොට් අංක 558 1/2 සහ 558 2/2) දිගුකාලින බදු ක්‍රමය යටතේ පරන්තන් කෙමිකල්ස් සමාගමට (2009 නොවැම්බර් 29 වන දින පටන් ක්‍රියාත්මක වන පරිදි) ප්‍රදානය කරන ලදී.

වර්ෂ 2008 වූ මැයි මස 01 වන දින සිට කළුතර පුලර්ටන් කර්මාන්ත ඒකකයේ කි.ග්‍රෑ.900 සිලින්ඩර්වල සිට කි.ග්‍රෑ.68 සිලින්ඩර්වලට ක්ලෝරින් නැවත පිරවීම ආරම්භ කරනු ලැබීය. මෙම නව ක්‍රියාමාර්ගය සමඟ පෞද්ගලික ආයතනයක් වෙත ඇදී ගිය විශාල මුදල් ප්‍රමාණයන් ඉතිරි කර ගැනීමට හැකි විය. විශේෂයෙන් 2012 වසර සඳහා රු. මිලියන 32.015 ක බදු පෙර ලාභයක්ද, 2013 වසර සඳහා රු. මිලියන 37.16 ක බදු පෙර ලාභයක් ද උපයා ඇත.

සමාගම තෝරා ගත් නව රසායන ද්‍රව්‍ය කිහිපයක් විකිණීම 2012 දෙවන කාර්තුවේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද මෑත කාලයේ කළුතර පුලර්ටන් ඒකකයේ සිදු වූ ක්ලෝරින් කාන්දුවත් සමඟ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලියට ඇති වූ දැඩි බලපෑම නිසා කල් දැමීමට තීරණය කෙරිණි.

2012 වර්ෂයෙදී කළුතර ඒකකය තුළ සිදු වූ ක්ලෝරින් කාන්දු වීම සිදු වීමට සමගාමීව එම කාර්යය සඳහා සුදුසු ස්ථානයක් සොයා ගැනීමට සමාගමට නොහැකි විය. එම හේතුව නිසාම 2013 වසර තුළ සිදු කිරීමට අපේක්ෂා කල නව රසායන ද්‍රව්‍ය නිෂ්පාදන කටයුතු ද කල් දැමීමට සිදුවිය. එය සමාගමේ ලාභයට ද දැඩි බලපෑමක් ඇති කළේය. එහෙත් මෙම වසරේ පූර්ව භාගයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් අක්කර 2 1/2 කින් යුක්ත භූමියක් හොරණ වගවත්ත කර්මාන්ත ඒකකයෙන් ලබා ගැනීමට හැකි වී ඇති අතර ඒ අනුව ක්ලෝරින් නැවත පිරවුම් ඒකකය එම ස්ථානයේ ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි.

සැලකිය යුතු රැකියා ප්‍රමාණයක් උත්පාදනය වීම තුළින් රටේ සංවර්ධනයට දායක වීමට හැකියාවක් ද මේ තුළින් ලැබෙනු ඇත.

## ආයතනික යහපාලනය

පරන්තන් කෙමිකල්ස් සමාගම උසස් යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීමට දැඩි කැපවීමෙන් බැඳී සිටින ආයතනයකි. යහපාලන සංකල්පය මූලික වශයෙන් ආයතනික ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ සේවකයින් පොදු රීති මාලාවකට සම්බන්ධ කොට සමාගමේ කොටස් හිමියන් සහ ඇල්මක් සහිත සියලු පාර්ශවයන්ගේ අරමුණු සාක්ෂාත් කරනු ලබන සංකල්පයකි. යහ කළමනාකරණය සාරධර්ම රැකගැනීමටත් කළමනාකරණයට සහ ව්‍යාපාර පරිපාලනයට හා ඉන් පාර්ෂවකරුවන් හට ද ඉහළ ප්‍රතිලාභයක් ලබා දීමට මග පාදයි. තවද සේවාවන්හි වගකිවයුතුභාවයද යහපාලන ප්‍රතිපත්තිවල තවත් අංගයකි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද යහපාලනය පිළිබඳ රීතිමාලාව මෙන්ම 2007 අංක 07 දරණ සමාගම් පනත සහ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මූල්‍ය රීති සංග්‍රහයට අප සමාගම දක්වන අනුකූලතාවය මෙම ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේදී මෙන්ම අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ සහ විගණන කමිටු වාර්තාවේ මැනවින් නිරූපණය කෙරේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

ආයතනයේ ප්‍රගමනය සහ සාර්ථකත්වය පිළිබඳ මූලික වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමූහිකව දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වන ව්‍යවසායකත්ව නායකත්වය ලබා දීම විචක්ෂණ සහ ඵලදායි රාමුවක් තුලදී ලබා දීම නිසා ආයතනයේ අවදානම හඳුනා ගැනීමට කළමනාකරණයට අනගි පිටුවහලක් සපයයි. ඔවුන්ගේ උපක්‍රමික දැක්ම, ආයතනය මූල්‍ය සහ මානව සම්පත ආයතනයේ අරමුණු ලඟා කර ගැනීමට යොදවන බවට සහ කළමනාකරණ ඵලදායිතා අධීක්ෂණය තහවුරු කරයි. එමෙන්ම ආයතනයේ වටිනාකම් සහ ප්‍රමිතීන් ස්ථාපනය කිරීමට සහ කොටස් හිමියන්ගේ මෙන්ම අදාළ වෙනත් පාර්ශවයන් කෙරෙහි වගකීම් ඉටුවන බවට තහවුරුවක් ලබා දෙයි. අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි පැවරෙන විශේෂිත වගකීම් පහත පරිදි වේ.

- කොටස් හිමියන්ගේ වටිනාකම ඉහළ නැංවීම.
- ආයතනික අරමුණු අයවැය සහ පුරෝකථනයන් නිරන්තර පසුවිපරම
- මෙහෙයුම් සහ ක්ෂේත්‍ර කාර්ය සාධන පසුවිපරම
- ප්‍රාග්ධන ආයෝජන අවස්ථා හඳුනා ගැනීම සහ පෙරගමන්කරුවකු වීම
- ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම තහවුරු කිරීම
- ඉතා ඉහළ මට්ටමේ ආචාර ධර්ම සහ නීතිගරුකතාවය තහවුරු කිරීම
- වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීමට අනුමැතිය ලබා දීම
- කොටස් හිමියන්ගේ අනුමැතිය සඳහා වාර්ෂික ලාභාංශ යෝජනා කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් පස් දෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ තනතුරු මතු සඳහන් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

සමාගම් ප්‍රගති වාර්තා නිරන්තරව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී විමර්ශනයට භාජනය කරන අතර ප්‍රමිතිගත න්‍යාය පත්‍රයක් අවශ්‍ය අවස්ථාවලදී අදාළ අමතර කරුණු ද ඇතුලත් කරමින් සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මසකට වරක් පවත්වනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහභාගිත්වය පිළිබඳ විස්තර පහත දක්වා ඇති පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම |  | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|---|
| ආර්.කේ.යු රණවීර මහතා | සභාපති සහ අධ්‍යක්ෂ (විධායක) | 12 |
| ඩබ්ලිව්.යූ.පෙරේරා මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 11 |
| ඒ.ඩී.එස්.කේ.නන්දසිරි මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 12 |
| එල්.යූ.පී.වික්‍රමසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 12 |
| එස්.අමරවීර මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 11 |
| ඩී.කේ.සුමනදාස මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 12 |
| සී.එච්.රන්තුංග මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 09 |
| ජේ.පී.ප්‍රියංගනී මහත්මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 03 |

**කළමණාකරණ කමිටු රැස්වීම්**

ආයතනයේ සභාපති, සාමාන්‍යාධිකාරී ආයතනයේ ඉහළ කලමණාකාරිත්වය සමඟ අවම වශයෙන් මසකට වරක් රැස්වීමක් පවත්වනු ලබන අතර එහිදී මෙහෙයුම් කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීම සහ තීරණ ගැනීම සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙරාතුව ව්‍යාපාරික තිරණ විස්තරාත්මකව විශ්ලේෂණයට ලක් කිරීම හා ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ මූලික තිරණ ගැනීම කළමනාකරණ කමිටුව මගින් ඉටු කෙරේ.

**අධ්‍යක්ෂ ධූරකාලය විශ්‍රාම ගැන්වීම සහ තෝරා පත්කර ගැනීම**

සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදීම තුනෙන් පංගුවක් වන සංඛ්‍යාවක අධ්‍යක්ෂවරුන් විශ්‍රාම ගැන්වෙන අතර (අධ්‍යක්ෂවරු තුනෙහි ගුණිතයක් වන අවස්ථාවක ආසන්නතම තුනෙන් එකට) නැවත තෝරා පත් කර ගැනීම සිදු කරනු ලබයි. ආයතනයේ ව්‍යවස්ථාවලිය අනුව පත් කර ගන්නා ලද අධ්‍යක්ෂවරයෙකු ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී නැවත පත් කර ගත යුතුය.

**විගණන කමිටු රැස්වීම්**

විගණන කමිටුව ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කරනු ලබන අතර යහපත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ආයතනය තුල පැවතීමට එය උපකාර වෙයි. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්ගෙන් සමන්විත වන අතර එහි සභාපතිවරයා මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා වේ. විගණන කමිටුව අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණකවරුන්, සාමාන්‍යාධිකාරී සහ ඉහළ කළමනාකරණයේ සාමාජිකයන් සිය රැස්වීම්ට සහභාගි කරගනු ලැබේ. විගණන කමිටුව නිරන්තරයෙන්ම අභ්‍යන්තර විගණක වාර්තා, මාසික ප්‍රගති වාර්තා, විකුණුම් වාර්තා, පද්ධති සහ පාලනයන් විමර්ශනයට භාජනය කරන අතර ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දෙනු ලබයි.

විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගිත්වය - 2020

| **අධ්‍යක්ෂවරු** | | **සහභාගිවූ රැස්වීම් සංඛ්‍යාව** |
|---|---|---|
| ජේ.පී. ප්‍රියංගනී මහත්මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 02 |
| සී. එච්.රණතුංග මහත්මිය | විධායක නොවන අධ්‍යක්ෂ | 02 |
| ඒ.ඞී.එස්.කේ. නන්දසිරි | විධායක නොවන අධ්‍යක්ෂ | 04 |
| එල්.යූ.පී.වික්‍රමසිංහ | විධායක නොවන අධ්‍යක්ෂ | 04 |

**අභ්‍යන්තර පාලනය**

සමාගමේ කොටස් හිමියන් අපේක්ෂිත ඉහළ ප්‍රතිලාභයන් ලබා දීම සඳහාත් ආයතනයේ වත්කම් සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහාත් අවශ්‍ය යහපත් අභ්‍යන්තර පාලන පරිසරයන් ඇති කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. ආයතනයේ ව්‍යාපාරික අවදානම එලදායි සහ සුදුසු ක්‍රමවේදයකට අනුකූලව සිදුකිරීමට අවශ්‍ය පද්ධතීන් බිහි කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිය වේ. ආයතනයට මුහුණදිය හැකි අවදානම් හඳුනා ගැනීම ඇගයීම සහ අධීක්ෂණය සහ විසඳුම් නිර්දේශ කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවට පවරා ඇත.

**මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සහ විනිවිද භාවය**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව සකස් කර ඇත. බාහිර විගණකවරුන් වන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුවයි. අවශ්‍ය සියලුම තොරතුරු සහ වාර්තා සපයා ඇත. ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් ඔවුන්ට ස්වාධීනව විගණනය සිදු කළ හැකි පරිසරයක් සපයා ඇති අතර ගිණුම් පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට ඔවුන්ට හැකි විය.

**සම්මත ආචාරධර්ම**

පිළිගත හැකි හැසිරීම් මත සියලුම සේවකයින්ට මග පෙන්වීම සඳහා විනය පිළිබඳ නීති ඇත. විනය රීති වල ප්‍රධාන අංග වන්නේ,

- සියලුම ක්‍රියාවන්හි සාධාරණත්වයල අවංකභාවය සහ අපක්ෂපාතීත්වය.
- නීති රීති පිළිබඳව දැනුවත් වීම සහ එයට අවනත වීම.
- ගණුදෙණු කරන සියලුම කාරණා වල රහස්‍ය භාවය.
- සමාගමට අහිතකර ලෙස පිළිබිඹු වන හෝ බලපෑම් කිරීමට ඉඩ ඇති හැසිරීම් වලින් වළකින්න.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ කාලසීමාව තුල දී ම ගෙවා නිම කරන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

**මූල්‍ය වාර්තා සහ ඉදිරිපත් කිරීම්**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විමර්ශනයට ලක් කරන ලද අතර ආයතනයේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීම පිළිබඳ සෑහීමකට පත් වේ. අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය මෙම ගිණුම් ප්‍රකාශනයේ 19 පිටුවේ සඳහන් වේ.

**සදාචාරාත්මක සම්මතයන්**

යහපාලනයේ කොටසක් ලෙස සේවකයන්ගෙන් ඉහළම සදාචාරාත්මක හැසිරීම් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය බව අධ්‍යක්ෂවරු විශ්වාස කරන අතර සේවකයින් සාධාරණවල අවංකව සහ පක්ෂපාතීව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරති. සියලුම සේවකයින් ව්‍යාපාර මෙහෙයුම් සිදුකිරීමේදී පාරිභෝගිකයින්ටල කොටස් හිමියන්ට සහ ප්‍රජාවට උපරිම උපරිමය ලබා දීමට බලාපොරොත්තු වේ.

**වයවස්ථාපිත ගෙවීම්**

රජයට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කර ඇති හෝ අදාළ තැන් සපයා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 සේවක ප්‍රතිලාභ (2006 සංශෝධිත) අනුව විශ්‍රාම පාරිතෝෂික ලබා දී ඇත.

**වගවීම සහ හෙළිදරව් කිරීම**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේදීල අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විසින් සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉදිරිපත් කරන බවට සෑහීමකට පත්වීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සවිස්තරාත්මකව සමාලෝචනය කර ඇත. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාගේ වගකීම් පිළිබඳ සාරාංශයක් 19 පිටුවේ දක්වා ඇත.

**අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,**
**පරන්තන් කෙමිකල්ස කම්පැනි ලිමිටඩ්**



**එච්. එල්. විපුල සිල්වා**
**අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්**

## විගණන කමිටු වාර්තාව

**විගණන කමිටුවේ කාර්යභාරය**

විගණන කමිටුවේ මූල්‍ය වාර්තාකරණය, විගණන ක්‍රියාවලිය හා යහපත් අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතීන් අභ්‍යන්තර සම්බන්ධතාව අධ්‍යනය කිරීම සහ එහි ගුණාත්මක ලක්‍ෂණ, අඩුපාඩු සහ අවශ්‍ය වර්ධනයන් පිළිබඳ අධ්‍යක්‍ෂ මණ්ඩලයට වාර්තා කිරීම විගණන කමිටුවේ මූලික කාර්යභාරය වේ. පහත සඳහන් කාර්ය පිළිබඳ අධීක්‍ෂණය සහ පසුවිපරම විගණන කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

- මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය සහ සම්පූර්ණභාවය
- අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණාත්මකතාවය හා සම්පූර්ණත්වය
- අභ්‍යන්තර හා බාහිර විගණනයේ කාර්යසාධන ඵලදායිතාව
- ව්‍යවස්ථාපිත සහ නීතිමය අනුකූලතාවය

**විගණන කමිටුව**

විධායක නොවන අධ්‍යක්‍ෂවරුන් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වන අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිත අධ්‍යක්‍ෂකතුමා එහි සභාපතිත්වය දරනු ලබයි. විගණන කමිටුව පහත අධ්‍යක්‍ෂකවරුන්ගෙන් සමන්විත වේ.

ජේ.පී.ප්‍රියංගනී මිය - විගණන කමිටුවේ සභාපති
ඒ.කේ.ඩී.නන්දසිරි මහතා - සාමාජික
එල්.යූ.පී.වික්‍රමසිංහ මහතා - සාමාජික

**රැස්වීම සහ සහභාගිත්වය**

විගණන කමිටුව 2020 වර්ෂය සඳහා රැස්වීම් වාර 04 ක් පවත්වා ඇති අතර එහිදී සාකච්ඡා කරන ලද වැදගත් කරුණු අධ්‍යක්‍ෂ මණ්ඩලයට වාර්තා කරන ලදි. විගණන කමිටුවල සහභාගිත්වය පිළිබඳ දත්ත ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත. විගණන කමිටුව අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණකවරුන්, කළමනාකාර අධ්‍යක්‍ෂ සහ ඉහළ කළමනාකරණයේ සාමාජිකයන් සිය රැස්වීමට සහභාගි කර ගනු ලැබේ.

**කාර්යභාරය**

කෙටුම්පත් ගිණුම් විමර්ශනය, බාහිර විගණක වාර්තාව, අභ්‍යන්තර විගණක වාර්තාව, මාසික ප්‍රගති වාර්තාව, විකුණුම් වාර්තාව සහ වංචා දෝෂ සහ මග හැරීම් ආදී ඇතිවිය හැකි දෝෂ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් සහ පසුවිපරම් කිරීමෙන් විගණක කමිටුව වටිනා කාර්යභාරයක් ආයතනය වෙනුවෙන් ඉටු කරනු ලබයි. අවදානම් අවම කිරීමට සහ පද්ධතිය තව දුරටත් ශක්තිමත් කරමින් වංචා, වැරදි සහ දෝෂ සිදුවීමට ඇති හැකියාව ඉතා අවම කරනු ලබයි.

**අභ්‍යන්තර පාලන පද්ධතිය**

2020 වර්ෂයේදී කමිටුව විසින් අභ්‍යන්තර විගණකවරුන්, M/S තිලක් ජයතිලක සහ සමාගම, වරලත් ගණකාධිකාරීවරුන් විසින් සිදු කරන ලද විගණනවල ප්‍රතිඵල සමාලෝචනය කරන ලදී. අභ්‍යන්තර විගණකවරයා (2016 වසර සඳහා), ඉදිරිපත් කරන ලද ඕනෑම නිර්දේශයක් ක්‍රියාත්මක කිරීම ඇතුළුව මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ ප්‍රතිචාරයේ ප්‍රමාණවත් භාවය සලකා බලන ලදී.

**අනුකූලතාවය**

විගණන කමිටුව විසින් ව්‍යවස්ථාපිත වෙන් කිරීම් සහ ගෙවීම්වල අනුකූලතාවය හා විශ්වාසදායක යාවත්කාලීන මූල්‍ය තොරතුරු 2007 අංක 7 දරණ සමාගම් පනත පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රීති මාලාවන්, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයත්, ප්‍රසම්පාදන රීති මාලාව සහ රජයේ චක්‍රලේඛවලට අනුකූලව සිදු කිරීමට මහත් පිටුවහලක් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ලබා දෙන ලදී.

**විගණන කමිටුව වෙනුවෙන්,**

ජේ.පී.ප්‍රියංගනී
විගණන කමිටුවේ සාමාජික
2022 මාර්තු 03

එල්.යූ.පී.වික්‍රමසිංහ
විගණන කමිටුවේ සාමාජික

## දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රධාන මූල්‍යමය අවස්ථා ඇතුලත් පස් අවුරුදු සාරාංශය

| | 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|---|---|
| ආදායම | 306,585,103 | 287,168,845 | 302,627,105 | 334,330,049 | 257,567,095 |
| විකුණුම් පිරිවැය | (152,926,005) | (151,904,349) | (157,924,310) | (164,351,617) | (121,547,124) |
| දළ ලාභය | 153,659,098 | 135,264,496 | 144,702,795 | 169,978,432 | 136,019,971 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 33,032,969 | 38,477,530 | 33,279,066 | 28,576,511 | 19,875,872 |
| | 186,692,066 | 173,742,026 | 177,981,861 | 198,554,944 | 155,895,543 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | (615,044) | (1,494,595) | (1,066,646) | (1,379,430) | (74,207) |
| පරිපාලන සහ ආයතන වියදම් | (103,994,475) | (98,614,771) | (102,402,002) | (97,143,590) | (93,983,932) |
| මූල්‍යමය වියදම් | (52,808) | (251,933) | (249,297) | (132,586) | (134,915) |
| බදු පූර්ව ලාභය | 82,029,740 | 73,380,727 | 74,263,916 | 99,899,337 | 61,029,489 |
| බදු අය කිරීම | (55,347,595) | (30,192,565) | (14,390,221) | (25,405,403) | (11,242,218) |
| කාල සීමාව සඳහා ශුද්ධ ලාභය | 26,682,144 | 43,188,162 | 59,873,695 | 74,493,934 | 49,787,271 |
| කොටස්කරුට ගෙවූ ලාභාංශය | - | 3,000,000 | 10,000,000 | 11,000,000 | 7,000,000 |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවත වත්කම්** | | | | | |
| දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ | 267,790,774 | 288,300,442 | 277,034,696 | 295,358,631 | 291,162,747 |
| කෙරිගෙන යන වැඩ | 19,085,178 | 7,994,545 | 17,156,866 | 7,705,010 | 6,006,192 |
| ජංගම වත්කම් | 574,173,410 | 497,595,389 | 428,844,185 | 378,048,948 | 298,183,249 |
| මුළු වත්කම් | 863,720,313 | 793,890,376 | 723,035,747 | 681,112,590 | 595,352,188 |
| **ස්කන්ධ මූල ධනය සහ බැරකම්** | | | | | |
| **මූළ ධනය හා සංචිත** | | | | | |
| ප්‍රකාශිත මූල ධනය | 40,000,000 | 40,000,000 | 40,000,000 | 40,000,000 | 108,500,000 |
| රඳවා ගත් ලාභය | 629,219,799 | 622,160,262 | 578,566,390 | 529,697,079 | 464,899,318 |
| කොටස් හිමියන්ගේ අරමුදල | 679,219,799 | 662,160,262 | 618,566,390 | 569,697,079 | 504,899,318 |
| ජංගම නොවන වත්කම් | 115,283,519 | 72,119,865 | 55,068,753 | 51,205,107 | 45,440,962 |
| ජංගම වත්කම් | 69,216,994 | 59,610,248 | 49,400,604 | 60,210,404 | 45,011,908 |
| මුලු ස්කන්ධ මූල ධනය සහ බැරකම් | 863,720,313 | 793,890,376 | 723,035,747 | 681,112,590 | 595,352,188 |

## රැස්වීම පිළිබඳ දැන්වීම

**සමාගමේ** 30 **වැනි වාර්ෂික මහා සභා රැස්වීම**, 2022 මාර්තු **මස** 28 **වන දින ප.ව. 2.00** ට නො 446, ගොල් රෝඩ්, රත්මලාන, **පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් ප්‍රධාන කාර්යාලයේ දී පැවැත්වෙනු ඇති බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.**

**න්‍යාය පත්‍රය**

1. 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කෙරුණු ගිණුම් ඉදිරිපත් කිරීම සහ ඒ සම්බන්ධව විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම.

2. අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශිත පරිදි ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

3. සමාගමේ ව්‍යවස්ථාවේ 87 සහ 88 වගන්තිවලට අනුකූලව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නැවත තෝරා පත් කිරීම.

මණ්ඩලයේ අණ පරිදි,

**එච්. එල්. විපුල සිල්වා**
**ලේකම්**
2022 මාර්තු 03

**සටහන් :**

1. **රැස්වීමට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා හිමිකම් ලබන සාමාජිකයෙකුට, ඔහු වෙනුවෙන් සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම පිණිස පුද්ගලයෙකු පත් කිරීම සඳහා හිමිකම් ඇත.**

2. **පෙරකලාසිකරුවෙකු සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.**

3. **පෙරකලාසි ආකෘති පත්‍රයක් මෙම වාර්තාවට අමුණා ඇත.**